භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2026 ජූලි - අගෝස්තු | 127 වන කාණ්ඩය - 04 කලාපය | පිටු 32 | DOP/MAGAZINE/03/2026

## අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය



ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව

ආරම්භය 1899

# සබඳ අපි කඳු නොවෙමු

ගී පද - දර්ශන මේදිස්
සංගීතය සහ ගායනය - විශාරද ගුණදාස කපුගේ



**සබඳ අපි කඳු නො වෙමු**
**උනුන් පරයා නැඟෙන**
**සුනිල දිය දහර වෙමු**
**එක ම ගඟකට වැටෙන**

**වියරු ගිනිදැල් නො වෙමු**
**වනය අවුළා තබන**
**සිහිල දෙන වැස්ස වෙමු**
**දැවෙන කැළයට වසින**

**නපුරු හීනය නො වෙමු**
**ළමුන් නිඳි සුව බිඳින**
**සොඳුරු අඬහැරය වෙමු**
**දනන් නින්දෙන් මුදන**

ගුණදාස කපුගේ සූරීන් විසින් ගයනු ලැබූ මෙම මානවවාදී ගීතය උපත ලබන්නේ, දර්ශන මේදිස් කිවිඳාණන්ගේ "කඳුළු මිටියාවත" කාව්‍ය කෘතියේ එන "උතුරින් දකුණට" කවි පංතියේ පැදි පෙළක් ලෙසිනි. කිවිවරයාණන්ගේ වදන්වලට මූලික වූ ප්‍රස්තුතය වූයේ එකල පැවති යුද ගැටුම් නිසා බිඳ වැටුණු දමිළ-සිංහල සහෝදරත්වය යි. එනමුදු විශිෂ්ට කලා කෘතියක් සැම විට කාලය සහ අවකාශය අතික්‍රමණය කරයි. මෙය ද එයට කදිම සාක්ෂියකි. අද අපි "අධ්‍යාපනය" නම් සන්දර්භය තුළ මෙම ගීතය විවරණය කර ගනිමු.

**"සබඳ අපි කඳු නො වෙමු - උනුන් පරයා නැඟෙන**
**සුනිල දිය දහර වෙමු - එක ම ගඟකට වැටෙන"**

අප රටේ අධ්‍යාපන ක්‍රමය තුළ තරග විභාග අනිවාර්ය අංගයකි. කුඩා දරුවන්ව පවා ශිෂ්‍යත්ව විභාගය හරහා අප බලහත්කාරයෙන් ඇතුළත් කරන්නේ තරගයකට නොවේ ද? අනෙකා කෙරේ දයාවන්ත වීම වෙනුවට, එයින් අනුබල ලැබෙන්නේ අනෙකා පරදවා උජාරුවෙන් නැඟී සිටීමට නොවේ ද?

පාසල් ක්‍රමය පවා අඩු වැඩි වශයෙන් ළමුන්ව භේදභින්න කරවයි. අතිදක්ෂයින්ට පමණක් යා හැකි "සුපිරි පාසල්" ද, යහමින් මුදල් දිය හැකි නම් යා හැකි "ප්‍රයිවට් කොලේජ්" ද, විදේශීය විෂය නිර්දේශයන් උගන්වන "ඉන්ටනැෂනල් ස්කූල්" ද, පාරුවෙන් එතෙර වී, ඒදණ්ඩෙන් එගොඩ වී, බස් එක නැති දාට පයින් යන ගමේ ඉස්කෝලේ ද ඇත්තේ එක ම පුංචි දූපතක් ඇතුළේ ය. සිංහල පාසල් - දමිළ පාසල් - මුස්ලිම් පාසල් යනුවෙන් ද, කතෝලික පාසල් - බෞද්ධ පාසල් - හින්දු පාසල් යනුවෙන් ද, එක ම අධ්‍යාපනයක් ලබන සිසුන් ආගම් සහ ජාතීන් ලෙස කෑලි වලට කපා ඇත්තේ ද මේ පුංචි ධර්මද්වීපය ඇතුළේ ය.

**"වියරු ගිනිදැල් නො වෙමු - වනය අවුළා තබන**
**සිහිල දෙන වැස්ස වෙමු - දැවෙන කැළයට වසින"**

ළමා සහ නව යොවුන් වියේ දී සමාජය විසින් ඔවුන්ව මෙලෙස වෙන් කළ පසු, පසු කාලීනව ඔවුන් එකිනෙකා කෙරේ සහකම්පනයෙන් යුත් වැඩිහිටියන් වේ යැයි සිතීම අසීරු ය. මෑත කාලීන ශ්‍රී ලංකා ඉතිහාසය ගෙන බලන්න. ජාතිවාදී යුද ගැටුම්, ආගම්වාදී ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රමාණය එක පොතකට ලඝු කළ නො හැකි තරම් ය. එහෙත්, නිවැරදි අධ්‍යාපනය දරුවන්ව යොමු කළ යුත්තේ "වියරු ගිනිදැල්" වීමට නොව "සිහිල දෙන වැස්ස" වීමට නොවේ ද?

**"නපුරු හීනය නො වෙමු - ළමුන් නිඳි සුව බිඳින**
**සොඳුරු අඬහැරය වෙමු - දනන් නින්දෙන් මුදන"**

අධ්‍යාපනය, ළමුන් තුළ ස්වභාවයෙන් දක්නට ලැබෙන සොයුරු පෙම, මිතුරු දම, සෙනෙහෙ සිත, මෙත් කුලුණු බිඳදමන "නපුරු හීනයක්" නො විය යුතු ය. ඒ වෙනුවට, එය ජනතාව අසංවේදිතාව නමැති නින්දෙන් මුදන "සොඳුරු අඬහැරයක්" ම විය යුතු ය.

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා**

# භක්ති ප්‍රබෝධනය

**2026 ජූලි - අගෝස්තු**

**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

**සංස්කරණ සහය**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ලහිරු දරණකුඹුර

**කවර නිර්මාණය**

අචල රූපසිංහ

**පරිගණක පිටු සැකසුම**

නිලුමිණ හර්ෂාන්

**මුද්‍රණය**

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.

## පිටුවෙන් පිටුව..........

2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 අධ්‍යාපනයෙන් පූර්ණ සජීවී ... - වි.ලෙ. පීරිස්

7 හිස පුරවන්න නැණ නුවණින් - මා ජයවීර

8 අධ්‍යාපනයේ ආධ්‍යාත්මික ... - සුනිල් තානාපති

9 ධර්ම චාරිකාව - සපුගස්කන්දේ රංජිත්

10 ජීවිතය නම් සරසවිය - ශෙලින්ඩා සමරසිංහ

12 අභීත මෙහෙවරක් කළ ... - මහින්ද නාමල්

14 ආධ්‍යාත්මික අධ්‍යාපන රටාවක් අවශ්‍ය කරන ...
කපිල ආසිරි සිල්වා

15 ලස්සන දේව මැවිල්ල
එච්. එම්. නෙතුනි ෆේත් පෙරේරා

16 කෙටි කතාව - කැතරින් ගුණවර්ධන

18 විලියම් ශේක්ස්පියර් - රාධා රන්ජනී ජයවර්ධන

20 අධ්‍යාත්මය නැති අධ්‍යාපනයක් ... - ජනිත් ශාමින්ද

21 අධ්‍යාපනය තුළින් ... - නීටා අයි. ප්‍රනාන්දු

22 **To draw out, not pour in**
Fr. Shalinda Jude OMI

24 මේ අහන්න... - රූපස් ප්‍රැන්සිස්
පාඩම්! පාඩම්! පාඩම්! - දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු
මෙන්න තවත් ත්‍යාගයක්...

25 කාව සිත - චමත් බී. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත

26 පුංචි විකුම් - තරු නැන්දා

27 ප්‍රහේලිකා අංක - 92
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා

28 ප්‍රහේලිකා අංක 90 පිළිතුරු හා ජයග්‍රහණ

29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය I
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව එළිදක්වන භක්ති ප්‍රබෝධනය ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව යි. භක්ති ප්‍රබෝධනය නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ භාරකාරත්වය යටතේ පළ වන ප්‍රකාශනයකි. (නි.ම.නි.)

Bhakthi Prabodhanaya, Published continuously since 1899, is the oldest Sinhala magazine in Sri Lanka. Bhakthi Prabodhanaya, is owned and published by the Colombo Province of the Oblates of Mary Immaculate. (O.M.I.)




## කවරයේ කථාව

අධ්‍යාපනය යන වචනයේ ඉංග්‍රීසි භාෂාවෙන් 'Education' වන අතර එය "ඉහළට රැගෙන ඒම", "පෝෂණය කිරීම" යන අරුත් ඇති 'Educare' යන ලතින් වචනයෙන් කැඩී බිඳී එන්නකි. මනුෂ්‍යයකු අධ්‍යාපනයට යොමු කරන්නේ ඔහුව හෝ ඇයව තවදුරටත් යාවත්කාලීන පරිනත මිනිසකු සේ සමාජයට පහන් ටැඹක් සේ දායාද කිරීමට ය. එසේ මනුෂ්‍යකු සැබෑ මිනිසකු ලෙස පෝෂණය කර ඔසොවා තැබීමට නම් අධ්‍යාපනයේ දිශානතිය ආධ්‍යාත්මික විය යුතු ම ය. නැතහොත් ඒ අධ්‍යාපනය ම මහත් සමාජ ජාලයක පරිහානියට මුල් වනු ඇත. අධ්‍යාත්මය යනු කිසිදු අන්තයකට සීමා නොවූ පර්යන්තයක් ද නොමැති පාරිශුද්ධ මාවතකි. ඉදින් මෙවර කවරය අපට ඇරයුම් කරන්නේ සමාජයේ මූලාරම්භය වන පවුල තුළින් අධ්‍යාපනයේ මඟ අධ්‍යාත්මය පදනම්ව තනන්නට පියවර තැබීමට ය. එය මුළු දේශයක් ඔසොවා තැබීමට මං තනනු ඇත.

අචල රූපසිංහ

### භක්ති ප්‍රබෝධනය

දායකත්වය එක් වසරකට - රු. 850.00 (මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00 (මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලු ම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල : bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

### BHAKTHI PRABODHANAYA

Rs. 850.00 for a year (Including Postage)

Rs. 1700.00 for two years (Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

හෙළිදරව්ව

# අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය



මනෝ විද්‍යා උපදේශක වෛද්‍ය චමින්ද වීරසිරිවර්ධන, මොළය සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙළ "අධ්‍යාපනය" ලෙස නිර්වචනය කරයි (Education is a science of brain development). මනෝ වෛද්‍යවරුන් පෙන්වා දෙන්නේ පූර්ණ ළමා විය සංවර්ධනය අධ්‍යාපනයේ මූලික ම පියවර ලෙස යි. එබැවින් මොළයේ ක්‍රියාකාරීත්වය සංවර්ධනය කිරීමෙන් තොරව පූර්ණ අධ්‍යාපනයක් පිළිබඳව සිතා ගැනීමට නො හැකි ය. මෙලෙසින් කල්පනා කරන විට කලින් අනාවැකි පළ කළ නො හැකි ජීවන අභියෝගවලට මුහුණ දිය හැකි පුරවැසියකු නිර්මාණය කිරීම අධ්‍යාපනයේ ප්‍රධාන ම පරමාර්ථයකි.

ඉගෙන ගැනීම යනු සාපේක්ෂව පුද්ගලයෙකුගේ චර්යාවල වෙනසක් ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව ඇති කර ගැනීම යි. දරුවකු අධ්‍යාපනය ලබා ගන්නේ විධිමත් සහ අවිධිමත් යන ක්‍රමවේදයන් හරහා ය. එය ශිෂ්‍ය කේන්ද්‍රීය විය යුතු ය. ඉගෙන ගැනීම සිදු වන්නේ තුන් ආකාරයකිනි. අතහැරීම (unlearned), අලුතින් ඉගෙන ගැනීම (learned), නැවත ඉගෙන ගැනීම (relearned) යනුවෙනි. ඉගෙන ගැනීම රඳා පවතින්නේ ප්‍රධාන පැතිකඩ තුනක් තුළ ය.

1. දැනුම (Knowledge)
2. ආකල්ප (Attitudes)
3. කුසලතා (Skills)

දැනුම යනුවෙන් බොහෝ විට අදහස් කරන්නේ මතකය යි. විධිමත් අධ්‍යාපනය හරහා ලබා ගන්නා දැනුම අධ්‍යාපනයේ එක අංශයක් පමණි. 'ප්‍රජානනය' (දැන ගැනීම) යන සංකල්පය තුළ මතු කරන්නේ දැනුම පමණක් නොව ඒ සමග බැඳෙන තවත් කාරණා ගණනාවක් ඇති බව ය. අවබෝධය, භාවිතය, විශ්ලේෂණය, සංස්ලේෂණය (සංක්ෂිප්ත කර දැක්වීම) සහ ඇගයීම ය. නිදසුනක් ලෙස ගුරුවරයා පන්තියට පැමිණීමට පෙර නො දැන සිටි දෙයක් සම්බන්ධයෙන් පන්තිය හමාර කරන විට දරුවා දැනුම ලබාගෙන තිබිය යුතු ය.

එමෙන් ම ශිෂ්‍යයාගේ ආකල්පවල වෙනසක් සිදු විය යුතු ය. නිදසුනක් ලෙස කසළ හැම තැන ම දමන්නට සිතෙන දරුවාට කසළ දැමිය යුතු ස්ථානයේ දැමීම නිසා ඇති කරන වෙනස ආකල්පමය වෙනසකි. එවිට ටොෆි කොළ හෝ හිස් ප්ලාස්ටික් වතුර බෝතල් තැන තැන නො දමා නිසි තැන ස්ථානගත කරන්නට දරුවා තුළ චරිතායනයක් නිරායාසයෙන් ඇති වනු ඇත.

තෙවනුව හැම දරුවකුට ම කුසලතා අඩු වැඩියෙන් ඇත. පොළොව යටින් මැණික් මතු කර ගන්නා සේ දරුවා සතු කුසලතාවන් ඔප මට්ටම් කරන්නට අවශ්‍ය පරිසරය සකස් කර දීම අධ්‍යාපනයේ තවත් ඉලක්කයකි. පෙර කාලයේ මෙන් ගණිතය හෝ විද්‍යා විෂයන් හරහා පමණක් දක්ෂයා සහ අදක්ෂයා තෝරා ගැනීම අද යල් පැන ගිය මිනුම් දණ්ඩකි.

වර්තමාන ලෝකයේ අධ්‍යාපනය බෙහෙවින් ම තරගකාරී ය. රැකියා ලබා ගැනීම සහ ආර්ථික සාර්ථකත්වය කේන්ද්‍ර කරගෙන එය ක්‍රියාත්මක වේ. එහෙත් මනුෂ්‍යයාගේ අභ්‍යන්තර සාමය, සදාචාරය සහ සමාජ වගකීම නොමැති නම් එකී දැනුමෙන් සමාජයට යහපතකට වඩා අගතියක් සිදු වේ. ඒ අනුව බලන කල අධ්‍යාපනයෙන් නිසි ඵල ප්‍රයෝජන ලබන්නට නම් මනුෂ්‍ය ජීවිතයේ බාහිර හා අභ්‍යන්තර යන අංශ දෙක ම සංවර්ධනය විය යුතු ය.

වර්තමාන අධ්‍යාපන ක්‍රමවේදය, අධ්‍යාපන පීඩනයක් (academic pressure) ළමයාට පමණක් නොව ගුරුවරුන්ට සහ දෙමව්පියන්ට ද එල්ල කර ඇත. අද බොහෝ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අධ්‍යාපනයේ ගොදුරක් වී ඇත. මානසික ආතතිය, තරගකාරී පීඩනය, ළමා ලෝකය අහිමි කිරීම සහ අනාගතය සම්බන්ධව අනිසි බියක් ඇති වී ඇත. ළමයාට ප්‍රබෝධවත් ව ඉගෙනීමට ඇති අවස්ථා අහුරා ඇත. අධ්‍යාපනය ජනතාව පෙළන, ගසා ගෙන කන මාෆියාවක් වී ඇත. ඇතැම් වෘත්තිකයෝ තමන් ක්ෂේත්‍රය තුළ ලබා ගත් විශේෂඥ දැනුම දඩමීමා කරගෙන දිළිඳුන්ව සූරා ගෙන කති. තමන් ලැබූ අධ්‍යාපනය නිසා දිළින්දන්ව තවත් අසරණ කරමින් ඇතැම් අවස්ථාවල තම වෘත්තියේ අයිතිවාසිකම් ලබා ගන්නට ඔවුන්ව පලිහක් කර ගන්නේ හිතක් පපුවක් නැතිව ය. විවිධාකාර ඇබ්බැහිවීම්වලට ගොදුරු වී, චිත්තවේග පාලනය කරගන්නට අපොහොසත්, ආවේගශීලී, අධික ලෙස කිපෙන, කිසිදු ගැටලුවක් සංවාද කර විසඳා ගැනීමට නොහැකි, විරුද්ධ මතයක් දැරිය නොහැකි අහංකාර "පිම්බෙන්නට" හදන මිනිසුන් අද බිහි වී ඇත.

එක්තරා වෛද්‍යවරයකු සංවර්ධිත රටක සංචාරය කරද්දී, තවත් එරට ජීවත් වන ඔහුගේ මිතුරෙක් සමග ගමන් කරන විට ඔහු පවසා ඇත්තේ රටක අධ්‍යාපනයේ ප්‍රමිතිය බලන්නට නිවැරදි නිර්ණායකයක් වන්නේ පහත සඳහන් කාරණා බව ය.

1. මාර්ගවල වාහන පදවන්නන් ඒ කාර්යයට කොපමණ විනය ගරුකව, ඉවසීමෙන් නියලෙනවා ද යන්න,
2. මිනිසුන් කාන්තාවන්ට කුමන අයුරින් සලකනවා ද යන්න,
3. දරුවන්ට කුමන අයුරින් සලකනවා ද යන්න යි.

අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය තුළ ආගමික සහ සංස්කෘතික වටිනාකම් වැදගත් වේ. විවිධ ආගම් මනුෂ්‍යයාට යහපත් ජීවිත පැවැත්මකට මූලධර්ම මතු කරයි. බුද්ධාගම, හින්දු, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි යන අප රටේ ප්‍රධාන ආගම් සතර ම මනුෂ්‍යත්වය, සාමය, සමානාත්මතාව සහ සැබෑ ප්‍රේමය ප්‍රවර්ධනය කරයි. අධ්‍යාපනයේ දී මෙම වටිනාකම් සිසුන්ට හඳුන්වා දීමෙන් සමාජයේ ආගමික සහජීවනය සහ එකමුතුකම වර්ධනය කළ හැකි ය. සත්‍යවාදීකම, අනුකම්පාව, කරුණාව, ඉවසීම, සමාව දීම, පරිත්‍යාගය, සහකම්පනය, වැයවීම, කැපවීම වැනි ගුණාංග ඇති පුද්ගලයෝ වටිනා පුරවැසියන් බවට පත් වෙති. මේ අය තමන්ගේ පෞද්ගලික අරමුණු පමණක් නොව සමාජයේ යහපත ගැන ද සිතීමට පුරුදු වෙති.


අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය තුළ ගුරු භූමිකාව ද ඉතා වැදගත් ය. ගුරුවරයා හුදෙක් විෂය දැනුම ලබා දෙන පුද්ගලයකු නොව සිසුන්ගේ චරිතය ගොඩ නගන මඟ පෙන්වන්නකු ද විය යුතු ය. ගුරුවරයාගේ හැසිරීම වචන සහ ආකල්ප සිසුනට බලපෑම් කරයි. එබැවින් ගුරුවරුන් දැනුවත් වන්නා සේ ම යහපත් විය යුතු ය. ආදරයෙන් සාධාරණව සහ ඉවසීමෙන් ගුරු භූමිකාව ජීවත් කළ යුතු ය. ගුරුවරුන්ව දැනුවත් කරන වැඩසටහන්, පුහුණුවීම් ආදි ගුරුවරුන්ගේ ගුණාත්මක ජීවිතය ගොඩ නගන්නට විවිධ ආකාරයෙන් ගුරුවරුන්ව බල ගැන්විය යුතු බව අවධාරණය කරමි.

පවුල සහ පාසල එකට එක්ව ආධ්‍යාත්මික වටිනාකම් දියත් කළ යුතු ය. දෙමව්පියන්ගේ හැසිරීම, ආදරය, ගෞරවය සහ සදාචාරාත්මක ජීවිතය දරුවන්ට අස්වැසිල්ලකි. ආධ්‍යාත්මික දිශානතියක් ඇති අධ්‍යාපනය රටක සාමය සහ සංවර්ධනය සඳහා වැදගත් වේ. ආධ්‍යාත්මික වටිනාකම්වලින් පිරිපුන් මිනිසුන් දූෂණය, හිංසනය සහ අසාධාරණ ක්‍රියාවලින් වැළකෙයි. ඔවුන් නීතියට ගරු කරන අතර සමාජ සාමය ආරක්ෂා කරයි. එමගින් රටක ආර්ථික, සමාජීය සහ සංස්කෘතික සංවර්ධනයට සක්‍රීය දායකත්වයක් ලබා දෙති. අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය ප්‍රමුඛතාවයක් ලෙස බලධාරීන් කල්පනා කරන්නේ නම් අධ්‍යාපනය මඟින් බුද්ධිමත් අය පමණක් නොව යහපත්, සාමකාමී, අවංක වගකීම් සහිත පුරවැසියන් බිහිවනු ඇත.

"ලෝකයට ආලෝකය පැමිණ තිබේ. එහෙත් තමන්ගේ ක්‍රියා නපුරු බැවින් මනුෂ්‍යයෝ ආලෝකයට වඩා අන්ධකාරයට ප්‍රිය කළහ. නපුරු ක්‍රියා කරන හැම දෙනා ම ආලෝකයට ද්වේශ කරති" (ජොහන් 3:19-20).

**සංස්කාරක පියතුමා**

# අධ්‍යාපනයෙන් පූර්ණ සජීවී මිනිසෙක් !



ගරු ඇලෝසියස් පීරිස් පියතුමා අධ්‍යාපනයේ පදාර්ථ අර්ථය පැහැදිලි කරන්නේ මෙසේ ය. අධ්‍යයන (අධි + අයන) යනු යෑමකි; ඉදිරි ගමනකි. එහි ප්‍රයෝජ්‍ය ක්‍රියාව වන 'අධ්‍යාපනය' යන්නෙන් කියැවෙන්නේ, යමෙකු යම්කිසි ඉලක්කයකට හෝ අරමුණකට හෝ යැවීමකි. අද පවතින අධ්‍යාපනය කුමන ඉලක්කයකට, අරමුණකට යොමු කරනු ලබනවා ද යන්න ප්‍රථමයෙන් ම අප විග්‍රහ කර ගත යුතුව ඇත.

**හීලෑ කිරීමේ අධ්‍යාපනය**

අද අධ්‍යාපනය දිශාගත වී ඇත්තේ, වෙළෙඳපොළ ආර්ථිකය මෙහෙයවීමේ ප්‍රබල බුද්ධිමය, තාක්ෂණික සහ ශ්‍රමික සම්පත් සපයන මාධ්‍ය ලෙස ය. මෙම අධ්‍යාපනය ත්‍රිවිධාකාරව හැඩගැසී ඇත. එනම් විධිමත් අධ්‍යාපනය, අවිධිමත් අධ්‍යාපනය සහ අනියම් අධ්‍යාපනය වෙයි. පාසල්, විශ්වවිද්‍යාල, තාක්ෂණික විදුහල් වැනි ආයතන, විධිමත් අධ්‍යාපන කාරකයක් බවට පත්වන අතර, වැඩිහිටි අධ්‍යාපනය, සම්මන්ත්‍රණ, අධ්‍යයනයන් අවිධිමත් අධ්‍යාපන කාරක වෙයි. පුවත්පත්, වාර සඟරා, රූපවාහිනිය, ගුවන්විදුලිය, චිත්‍රපටි ඇතුළත් වන්නේ අනියම් අධ්‍යාපන කාරකය තුළට ය. අද බොහෝ දුරට මේ ත්‍රිවිධ අධ්‍යාපන කාරකයන් ඉලක්කගත කර ගෙන ඇත්තේ වෙළෙඳපොළ ආර්ථිකය සුවච කීකරු පාරිභෝගිකයන් බවට පත් කරගනු ලැබීමට ය. මේ ප්‍රවණතාවන් තුළ ආධ්‍යාත්මික සාරධර්ම සෝදා පාළුවට යොමු වීම සිදු වේ. ආධ්‍යාත්මික සාරධර්ම ප්‍රගුණ කරවීමේ අද්විතීය වගකීම පැවරී තිබෙන්නේ ආගමික ආයතනවලට ය. නමුත් බොහෝ දුරට භක්ති අභ්‍යාසවලට සීමා වීම නිසා සාරධර්ම සෝදා පාළුවට එරෙහිව උඩුගම් බලා පිහිනන්නට ආගමික ආයතන අසමත් වී ඇති බව කනගාටුවෙන් වුව ද කිව යුතුව ඇත.

වෙළෙඳපොළට මානව සම්පත් සපයන විධිමත් පාසල් අධ්‍යාපනය තුළ ආගම ධර්මය හුදු විභාග සමත් වීමේ විෂයක් බවට පරිවර්තනය කරගෙන විභාගවල දී පරීක්ෂා කරනු ලබනුයේ ආගමික ධර්ම කාරණාවන් ය. දහම් පාසල්වලට බොහෝ දුරට "දැනුම" කේන්ද්‍ර කරගත් ඉගැන්වීමක් සිදු කරනු ලැබේ. මෙහි දී ආගමික සාරධර්ම හෙවත් ආධ්‍යාත්මික සාරධර්ම භාවිතයට ප්‍රායෝගික අවස්ථා සපයනු නො ලැබේ. ධාර්මික වටිනාකම් ගොඩ නැඟෙන්නේ අත්විඳීමෙන් ය. අත්විඳීමකින් තොරව ආධ්‍යාත්මික සංවර්ධනයක් බලාපොරොත්තු විය නො හැකි ය.

**පූර්ණ සජීවී මිනිසා**

ජීවිත ප්‍රවර්ධක ප්‍රවීණයකු වන ස්ටීවන් කොවේ පෙන්වාදෙන පරිදි, කය, මනස, හදවත සහ අධ්‍යාත්මය යන සුවිශේෂාංගවලින් සංයුක්ත වීමෙන් මිනිසුන් වන අපේ "ස්වභාවය", නිර්මාණය වී ඇත. මේ විශිෂ්ට අංග හතරට ම අනුරූපව ධාරිතාවන් හෙවත් බුද්ධීන් හතරක් සම්පාදනය වී අතර, ඒවා කායික බුද්ධිය, මානසික බුද්ධිය, චිත්තවේගී බුද්ධිය සහ ආධ්‍යාත්මික බුද්ධිය වෙයි. මිනිසුන් වන අප පූර්ණ මිනිසුන් වන්නේ මේ බුද්ධි හතර ඒකාග්‍ර වූවොත් පමණ ය. මේ බුද්ධීන් හතරෙන් මිනිසාට පමණක් සීමා වන බුද්ධිය ආධ්‍යාත්මික බුද්ධිය වේ. අනෙක් සතුනට මෙම ආධ්‍යාත්මික බුද්ධිය නැත. සමහර මිනිසුන් සතුන් ලෙස හැසිරෙන්නේ ආධ්‍යාත්මික බුද්ධිය නොසලකා හැරීමෙන් හෝ විනාශ කිරීමෙන් ය. අන් බුද්ධි තුනට ම වඩා ආධ්‍යාත්මික බුද්ධිය විශේෂ වන්නේ, අනෙක් බුද්ධි තුන කෙරෙහි ම

බලපෑමක් ඇති කිරීමේ ධාරිතාව නිසා ය. කායික බුද්ධිය විසින් කායික විද්‍යාත්මක ක්‍රියාවලියෙන් මෙහෙයවනු ලබන් අතර ඒවා සුමටව පවත්වා ගැනීමට ආධ්‍යාත්මික බුද්ධිය ධනාත්මකව ක්‍රියාකරන අතර, ආධ්‍යාත්මික බුද්ධිය නොසලකා හැරීමෙන් කායික විද්‍යාත්මක ක්‍රියාවලිය දුර්වල කරයි. එමඟින් පූර්ණත්වයට හානි සිදු කර ගනු ලැබේ. අධ්‍යාත්මික සාරධර්ම ගුණාත්මකව ක්‍රියාත්මක වන විට අපි නිරෝගී මිනිසුන් බවට පත් වෙමු. අද බොහෝ දුරට ත්‍රිවිධාකාර අධ්‍යයන කාරකයන් හරහා සිදු කරනු ලබන්නේ චිත්තවේග හසුරුවාලීමට වඩා විකෘති කිරීම ය. ආධ්‍යාත්මික බුද්ධියෙන් හසුරුවනු ලබන මිනිසා ක්‍රියාකාරී සජීවී මිනිසෙකි. අධ්‍යාපනයේ අරමුණ හෙවත් ඉලක්කය විය යුත්තේ පරිසරයෙන් නැඟෙන උත්තේජනවලට සත් ප්‍රතිචාර දැක්විය හැකි අධ්‍යාත්මයෙන් පණගැන්වුණු පූර්ණ සජීවී මිනිසුන් තැනීම ය.

උත්තේජන (ස්වාභාවික, සමාජ ආර්ථික පරිසරයෙන්) ⟶ ප්‍රතිචාර ⟶ පූර්ණ සජීවී මිනිසා

පූර්ණ සජීවී මිනිසා සොබාදහමට ආදරය කරයි; එය රකියි. එමෙන් ම උස් පහත් භේද නොතකා සියලු ම මිනිසුන්ට ආදරය කරයි; ගෞරවය කරයි. පීඩාවට පත්වූවන් කෙරෙහි දයානුකම්පාව, සෙනෙහස දක්වයි. සත්‍යය වෙනුවෙන් පෙනී සිටිමින් අසත්‍යය හෙළා දකින අතර, යහපත වෙනුවෙන් පෙනී සිටිමින් අයහපත හෙළා දකියි. අයුක්තියට එරෙහිව එඩිතරව නැඟී සිටියි. අනෙකාගේ යහපත වෙනුවෙන් දුක් විඳින්නට, පීඩා විඳින්නට සූදානමෙන් සිටියි.

### දේව මහිමය

පූර්ණ සජීවී මිනිසා දේව මහිමය ප්‍රකාශ කරයි. මෙලෙස දේව මහිමය තම ජීවිතයෙන් ප්‍රකාශ කළ, අප දන්නා ප්‍රථම ප්‍රතිමූර්තිය අන් කිසි කවරෙකුවත් නොව නාසරෙත්හි ජේසුස් වහන්සේ ය. උන් වහන්සේ, "ක්‍රිස්තුස්" යන නමින් හැඳින්වූයේ තම ජීවිතයෙන් දේව මහිමය ප්‍රකාශ කළ නිසා ය. දේව සමානකමට මවන ලද මිනිසුන් වන අප සෑම කෙනකු තුළ ම දේව ස්වභාවයක් ඇත. මිනිසකු ලෙස ජේසුස් වහන්සේ කළේ තම අධ්‍යාත්මයේ රැඳී පවතින දේව ස්වභාවය පණ ගැන්වීම ය. උන් වහන්සේ තම දේව ස්වභාවය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කළේ තම දූත මෙහෙවර තුළින් ය (ලූක් 4:17-19).

ජේසුස් වහන්සේ දිළිඳුන් පීඩිතයන් මුදවාලීමට ද, නැති වූ බැටළුවන් සොයා යාමට ද පෙලැඹුණේ උන් වහන්සේ තුළ දැල්වුණ දයා කරුණාවෙන් ය. එමෙන් ම තම සේවාවේ යොමුව වූයේ සේවය ලැබීම නොව සේවය කිරීම ය. එම යොමුවට හේතුව වූයේ බැහැපත්කම යි. කිතුනුවන් ලෙස අප අපේ ජීවිත මෙහෙවර හැඩ ගසා ගත යුත්තේ මේ දයා කරුණාව සහ බැහැපත්කම පදනම් කරගෙන ය. නමුත් අද පවතින තරගකාරී, ධනලෝභී, බලලෝභී සමාජය ඉදිරිපිට අපේ ජීවිත මෙහෙවර යොමුගත කරමින්, එය සාක්ෂාත් කර ගැනීමට නම් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පදනම් කරගත් ආධ්‍යාත්මික වටිනාකම් අප වර්ධනය කර ගත යුතු ය. නමුත් අද පවතින තුන්වැදෑරුම් අධ්‍යයන කාරකයන්ගෙන් එය බලාපොරොත්තු විය නො හැකි ය. එනම් විකල්පය කුමක් ද?

### විකල්ප අධ්‍යාපන ප්‍රවේශය

මෙම ප්‍රවේශයෙන් අප බලාපොරොත්තු වන්නේ විශ්වාසවන්ත බව, බලාපොරොත්තු සහගත බව, ආදරණීය බව, විචාරශීලි බව, නිහතමානී බැහැපත්කම, සක්‍රීය සවන්දීමේ හැකියාව, තේරුම් ගැනීම (අන් අයව), සංයමය, නොසැලෙන අධිෂ්ඨානය සහ උපේක්ෂාව යන සාරධර්ම ප්‍රගුණ කිරීම ය. මෙම ආධ්‍යාත්මික සාරධර්ම ප්‍රගුණ කිරීමේ අධ්‍යාපන ක්‍රමවේදයක් වන, "පීඩිතයන්ගේ අධ්‍යාපන ක්‍රමවේදය" නිර්මාණය කර ඇත්තේ බ්‍රසීලයේ මහාචාර්ය පවුලො ෆ්‍රොයිරෙ සූරීන් විසිනි. එතුමා කම්පිනාස් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ, සාඕ පාවුලෝ පොන්ටොෆිකල් (PONTIFICAL) කතෝලික විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ලෙස සේවය කර ඇති අතර යුනෙස්කෝවේ ද සේවය කර ඇත. "ගැටලු

මූලික" අධ්‍යාපනය යනුවෙන් හඳුන්වමින්, එම ගැටලුවලට හේතු ප්‍රශ්න කිරීමේ ක්‍රියාවලියකින් සෙවිල්ලේ යෙදෙන අතර, එම ක්‍රියාවලිය සංවාදශීලීව ගෙන යෑම ප්‍රමුඛ වේ. ලෝකය සඳහා සහ මිනිසුන් සඳහා ගැඹුරු ප්‍රේමයක් රහිතව සැබෑ සංවාදයක් ගෙන යා නොහැකි ය. අද පවතින අධ්‍යාපන ක්‍රමවේදයෙන් කරනු ලබන්නේ "දැනුම" තැන්පත් කර, විභාග ක්‍රමවලින් එම දැනුම පරීක්ෂා කර සහතික ප්‍රදානය කරනු ලැබීම ය.

නමුත් මේ විකල්ප ප්‍රවේශයෙන් සිදු වනුයේ නව යථාර්ථය පිළිබඳව සවිඥානිකව තේරුම් ගනිමින්, ඒ සඳහා ක්‍රියාකාරී වෙමින් රිසි පරිදි යථාර්ථය වෙනස් කිරීමට නැඹුරු වීම ය. අපේ පාසල් අධ්‍යාපනයේ දී, මෙම අධ්‍යාපන ක්‍රමවේදය අත්හදා බැලීමට 1971 - 1976 රජය උනන්දු වූ අතර, පසුව පැවැති රජයන් විසින් එය නොසලකා හරින ලදී.

**අභියෝගය**

ආගමික අධ්‍යාපනය පවා පදනම් වී ඇත්තේ දැනුම තැන්පත් කිරීමේ, බැංකු සංකල්පය මත ය. ඒ නිසා පුද්ගල ජීවිතවලත්, සමාජ ජීවිතයේත් චර්යාවන්ගේ වෙනස්කම් සුගතිගාමීව සිදු නොවේ. ඉහත දැක්වූ පරිදි ආධ්‍යාත්මික සාරධර්ම ප්‍රවර්ධනය සඳහා මෙම විකල්ප අධ්‍යාපන ක්‍රමවේදය යොදවා ගැනීමේ අභියෝගය අප ඉදිරියේ ඇත. අද පවතින දහම් පාසල් අධ්‍යාපන ක්‍රම බොහෝ දුරට සීමා වී ඇත්තේ දහම් දැනුම ලබා දීමට ය. අත්දැකීම් තුළින් කිතුනු දිවි පැවැත්මකට දරුවන් යොමු කරන දහම් පාසල් ව්‍යාපෘති ඉගෙනුම් - ඉගැන්වීමේ ක්‍රමවේදයක් කුරුණෑගල පදවියේ ගරු ලයනල් ප්‍රනාන්දු පියතුමා නම් "දහම් ගුරු භූමිකාවේ කැඳවීම සහ වගකීම" ග්‍රන්ථයෙන් ඉදිරිපත් කර ඇත. 2-3 ශ්‍රේණිවලට සහ 4-11 ශ්‍රේණි දක්වා ආදර්ශ ව්‍යාපෘති හඳුන්වා දී ඇත. (2020 - ජනවාරි) මෙම ව්‍යාපෘති ප්‍රායෝගිකව ද කර ඇත. අනෙකුත් පදවිවල දහම් පාසල්වලට මෙය ආදේශ කර ගත හැකි ය. මෙමඟින් දේව මහිමය ප්‍රකාශ කරන පූර්ණ සජීවී දරුවන් ගොඩ නැඟිය හැක. වැඩිහිටි අධ්‍යාපනයේ දී පෙර දක්වන ලද විකල්ප අධ්‍යාපන ප්‍රවේශය යොදා ගැනීමෙන් දේව මහිමය ප්‍රකාශ කරන ජනතාවක් ගොඩ නඟාගත හැකි ය.

**"අධ්‍යාපනය" - 2004 ජනවාරි භක්ති ප්‍රබෝධනය (ශික්ෂණයෙන් තොර අධ්‍යාපනය අහිතකර ය).**

**වි.ලෙ. පීරිස්**

## හිස පූරවන්න නැණ නුවණින්

හිස පුරවන්න නැණ නුවණින් උතුරන්න
ගත් ගනු වෙහෙස බැහැ වදනින් පවසන්න
දැනුමෙන් මුදුන් වුණි හැකි විය රජ වෙන්න
ගුණ සුන් කෙනෙකු නම් හිස් බව දැක ගන්න

වලා මඬල මත දැනුමෙන් තැනූ මැඳුරු
බලා පිදුම් කළමුත් නිබඳව කවුරු
සලා පියා උඩ යයි දැනුමට ගැඹුරු
වෙළා නැතොත් හද ගුණදම් දිවි අඳුරු

රජ වී උගත්කම් වපුරා මිහි මඬලේ
රට ගම වටා නම තනතුරු නිති දිදුලේ
හද විල නොපිපි ද යහ ගුණ මල් විපුලේ
ලද මහ දැනුම ගල් වැලි බොරළු ය මිදුලේ

අද මව්පියන් දරු 'අකුරට' පෙළ ගස්සා
අහස් මාළිගා තන තන උඩ උස්සා
සිටියත් අහෝ ගුණදම් ගිය දින ලිස්සා
දරු පිරිවරට ජීවිතයෙන් පසු බැස්සා

හිසක් වටා තිබුණත් නැණ කිරුළ අරා
උතුම් මිනිස් ගුණදම් හදවත ම පුරා
නැතොත් දැනුම යයි අගතිය ගැටුම කරා
හිසට නුවණ ගෙන යනු සිත දහම දරා

දැනුමයි දහම නැණ ගුණ සම සමව ගෙන
වැජඹෙන මිනිස්කම ලොව රජ කරන දින
මේ මහ පොළොව සතු සාමය සතුට ගැන
සඳෙසක් ලියමි මල් පෙත්තක සුවඳ දෙන

**මා ජයවීර - පිටිපන.**

# අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය



අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය යන්නට, තනි වාක්‍යයකින් ප්‍රකාශ කළ හැකි අර්ථ කථනයක් වනුයේ 'මානවයාගේ පරිපූර්ණ සංවර්ධනය ඉලක්ක කරගත් හෝ අරමුණු කරගත් ප්‍රවේශ මාර්ගයක්' ලෙසිනි. අධ්‍යාපනය නිර්වචනය කිරීමේ දී දැක්වෙන දැනුම, කුසලතා යන්නෙන් ඔබ්බට යන්නාවූ ද, බුද්ධි වර්ධනයට පමණක් සීමා නොවී ජීවිත අභ්‍යන්තරය, ජීවිතයේ අරමුණු හා අභිමතාර්ථ, චරිත සංවර්ධනය, සමාජ වටිනාකම් මෙන් ම සමාජය සමඟ ඇතිකර ගන්නා යහපත් සබඳතා වර්ධනය යනාදි විවිධ සංරචක අත්‍යවශ්‍ය සාධක බව පිළිගන්නාවූ ද පද්ධතියක් වේ.

මෙම මාතෘකාවේ අධ්‍යාපනය යන්නට ප්‍රමුඛතාවක් ලබා දී ඇති හෙයින්, පාසල් අධ්‍යාපනය ලබන වයසේ පසුවන දූවාදරුවන් කේන්ද්‍ර කර මෙම ලිපියේ මතු අන්තර්ගතය ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කරමි. "මම කවුරු ද? මාගේ ජීවිත අරමුණු කවරේ ද? මා සමාජය තුළ හැසිරිය යුත්තේ කෙසේ ද?" යනුවෙන් දරුවකුගේ සිහියට නැඟෙන මූලික මානව ප්‍රශ්නවලට පිළිතුරු සොයා දීමට මඟ පෙන්වීමක්, මෙකී ප්‍රවේශයේ ප්‍රධානතම අපේක්ෂාව විය යුත්තේ ය. මෙම දිශානතියේ වපසරිය තුළ ඇති සුවිශේෂී සංරචකයන්ගෙන් පළමු කොට ජීවිතයේ අරමුණු හා අභිමතාර්ථ ගැන විමසමු. දරුවකු ස්වවටිනාකම හඳුනා ගැනීම හා ඒවා ධනාත්මකව ප්‍රගුණ කිරීමට ගත යුතු උපාය මාර්ග යන් පෙන්වා දීම මෙන්ම සත්‍ය බව, කරුණාව, සරලත්වය, ගරු කිරීම හා විශේෂයෙන් ම ස්වයං විනය වැනි මානුෂීය ගුණාංග තම ජීවිතයට එකතු කර ගැනීමට සැලැස්වීමෙන්, දරුවාට තම ජීවන ගමන් මඟෙහි සාර්ථකත්වය කරා ක්‍රමයෙන් ළඟා වීමට හැකියාවක් ලැබෙනු ඇත.

ඉන් අනතුරුව අප පිවිසෙනුයේ අභ්‍යන්තර සතිමත් බව හඳුනා ගැනීමට ය. සතිමත් බව යනු වර්තමාන මොහොතේ සිදු වන දේ පිළිබඳව අවබෝධයක් සහිතව, පූර්ව විනිශ්චයකින් තොරව සිහියෙන් යුතුව සිත (මනස) පවත්වා ගැනීම යි. සතිමත් බවේ ප්‍රධාන කරුණු ලෙස වර්තමානයේ ජීවත් වීම, තමන්ගේ සිතිවිලි හැඟීම් පිළිබඳ අවබෝධයෙන් යුතුව බැලීම සහ සාමකාමී මනස යන්න දැක්විය හැකි ය. මධ්‍යස්ථ සමබර සිතකින් යුක්තව යමක් විමසීම ගැඹුරු චින්තනය නම් වේ. මෙහි වැදගත් අංගයක් ලෙස මනෝ ගවේෂණාත්මක පුහුණුව දැක්විය හැකි ය. මෙයින් අදහස් කරනුයේ මනෝවිද්‍යාත්මක විෂය ක්ෂේත්‍රයේ මූලික අධ්‍යයනයන් හා ඒවායේ වැදගත්කම පිළිබඳව වන පුහුණුව යි. එයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍ර කිහිපයක් පහත පරිදි වේ. උපදේශනය, මනෝචිකිත්සාව, මානසික සෞඛ්‍යය, අධ්‍යාපන මනෝ විද්‍යාව සහ මානව හැසිරීම් හා සංවර්ධනය නම් වේ.

උසස් ප්‍රමිතීන්ට අනුකූලව මෙම ක්‍රියාවලිය කෙරෙහි දරුවන් යොමු කරවීම තුළින්, බාල පරපුර තම සිතුවිලි, හැඟීම් හා ප්‍රේරණ පිළිබඳ ප්‍රාමාණික අවබෝධයකින් සන්නද්ධ වේ. ක්‍රමානුකූලව බාල පරපුර තුළ මානසික සෞඛ්‍යය, ස්ථායීතාවය හා අභ්‍යන්තර සහනය වර්ධනය වනු ඇත.

සමස්ත සමාජය සමඟ යහපත් සම්බන්ධතා ඇති කර ගෙන පවත්වා ගෙන යා හැක්කේ කෙසේ ද යන අවබෝධය, දැනුම හා හැඟීම, මෙම ප්‍රවේශය මඟින් ළමා පරපුර ලබා ගනියි. තමා මානව කුලකයේ මෙන් ම පරිසරය නම් වූ කුලකයේ ද අවයවයක් බව දරුවකු අවබෝධ

කර ගැනීම තුළින් යහපත් මෙන් ම ලස්සන අනාගතයක පෙර ගමන්කරුවකු වනු ඇත.

මෙහි දී ඉතා වැදගත් භූමිකාවක් ඉටු කිරීම වැඩිහිටියන්ගෙන් අපේක්ෂා කෙරේ. විශේෂයෙන් ම ආගමික නායකයෝ මෙහි දී ප්‍රමුඛස්ථානය ගනිති. නූතන සමාජයේ නිර්වචනයන්ට අනුව ආගම යනු මිනිසාගේ ලෞකික හා ලෝකෝත්තර විමුක්තිය උදෙසා අනුගමනය කරන, යම් ශුද්ධ වූ විශ්වාසයන්, සදාචාරාත්මක වටිනාකම්, පුදපූජා සහ සංස්කෘතික පද්ධතියක් මත පදනම් වූ ජීවිත රටාවකි. ඒ අනුව, තමන්ට ආවේණික වූ විශ්වාසයන් හා භක්තීන්ට අනුකූලව, බාල පරපුර යොමු කරලීම ආගමික නායකතුමන් සතු වගකීමකි. මෙහි දී ගුරුවරුන්ට පැවරී ඇති කාර්ය භාරයත් ද ප්‍රමුඛස්ථානයක් ගනී. විශේෂ කොට සැලකීමේ දී ගුරුවරුන් දැනුම ලබා දෙන්නන් පමණක් නොව ජීවිත ආදර්ශයන් ලෙස දරුවන් තුළ විද්‍යමාන වන්නන් විය යුතු ම ය.

අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය යන්න නැවතත් තනි වාක්‍යයකින් ප්‍රකාශ කළහොත්, එය පුද්ගලයෙකුගේ භෞතිකය, මනස හා ආත්මය යන සියලු පැතිකඩ සංවර්ධනය කරා ගෙන යාමට මහත් වූ පිටිවහලක් ගෙන දෙන්නක් ලෙසට ද දැක්විය හැකි ය. මෙම ලිපිය අවසන් කිරීම සඳහා අප සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රකාශයක් උපුටා දක්වමි. අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය යන්නට අයත් වන්නා වූ සියලු කරුණු කාරණා ජේසුස් වහන්සේගේ මතු දැක්වෙන ප්‍රකාශයේ අන්තර්ගත වන බව ගැඹුරු මනසකින් යුතුව මෙනෙහි කිරීමෙන් ඔබට වැටහෙනු ඇත. එම ප්‍රකාශය වන්නේ "බාලයන් මා වෙතට එන්න ඉඩ හරින්න" (මතෙව් 19:14, මාක් 10:13, ලූක් 18:16).

**සුනිල් තානාපති**
**අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික),**
**පයාගල.**

# ධර්ම චාරිකාව

"අඳුරු අහස් ගැබ කෙළවර
රන්වන් පැහැයෙන් පායන
පහන් තරුව දැක ගන්නට
ඒ බව දැන හෝ නොම දැන
ඔබත් මමත් අපි හැම දෙන
යමින් සිටිමු එක ම අතට"

**- මහගම සේකර (සක්වා ලිහිණි) -**

දැන හෝ නො දැන අප හැම දෙන ම ගමන් කරමින් සිටින්නේ සැනසිල්ල සොයමින් ය. එය හමුවන තෙක් ම සැනසිල්ල කුමක් දැ යි අපි නො දනිමු. ඒ ගැන අප තුළ ඇත්තේ විවිධ අනුමානයන් ය. සැනසිල්ල කුමක් දැ යි ශුද්ධාත්මයාණන්ගෙන් මිස අනෙකකුගෙන් හෝ පොතපතකින් ප්‍රත්‍යක්ෂ කර ගන්නට අපට බැරි ය. අනෙකකුට උගන්වන්නවත් ග්‍රන්ථාරූඪ කරන්නවත් බැරි ය.

ධනය, බලය, කීර්තිය, රූමත්කම, කම්සැප, මත්පැන් ආදිය තුළ සැනසිල්ල ඇතැයි සිතා ගෙන ඉන්නා අය ඒවා හඹා යමින් වෙහෙසෙති. සමහරු තම තමන්ගේ ආගමික ඇදහීම් තුළින් එය සොයමින් සිටිති. අප කවුරුත් සොයමින් සිටින අකාලික සැනසිල්ල විවිධ ආගම්හි විවිධ නාමයන්ගෙන් හැඳින්වේ. සැබෑ ප්‍රේමය, ස්වර්ගීය ප්‍රීතිය, ඇතුළාන්ත සාමය, නිවීම ආදී විවිධ නාමයන් මඟින් එය හැඳින්වේ.

එය සොයමින් සමහරු වැරදි මඟ යති. සමහරු නිවැරදි මඟ යති. කෙසේ වෙතත් එය හමුවන්නේ ස්වල්ප දෙනෙකුට ය; මාර්ගයත් පටු ය. හරි ද වැරදි ද ගමන මා යන? ඒ ගැන වූ නිරන්තර විමසුම අපේ චාරිකාව සාර්ථක කර ගැනීම සඳහා ආලෝකයකි; ශක්තියකි; තෘප්තියකි. හරි ද වැරදි ගමන අප යන? එම විමසිලිමත් බව අප තුළින් ගිලිහුණහොත්, කිසියම් ඇබ්බැහියකට අප යාන්ත්‍රික විය හැකි ය. අපව මංමුළා විය හැකි ය.

**සපුගස්කන්දේ රංජිත්.**

# ජීවිතය නම් සරසවිය

"බොහෝ දෙනා අධ්‍යාපනය යනුවෙන් අදහස් කරන්නේ ළමයා තම සමාජයේ වැඩිහිටියන්ගේ ආකාරයට පමුණුවා ගැනීම යි. එහෙත් මා අධ්‍යාපනය දකින්නේ නිර්මාණශීලීන් බිහි කරන ක්‍රියාවලියක් වශයෙනි. ලොවට අවශ්‍ය වන්නේ නව නිපැයුම්කරුවන් ගවේෂකයින් මිස පවත්නා සමාජයට අනුගත ගතානුගතිකයන් නොවේ."

- **ජීන් ජියාජේ** -

බිළිඳකු විලසින් මෙලොව එළිය දකින දරුවා ප්‍රථමයෙන් ලෝකය පිළිබඳ පළමු අධ්‍යාපනය ලබනුයේ තම පවුල තුළිනි. ඒ අනුව බිළිඳු අවධියේ සිට තම නිවස තුළ ලබන්නා වූ අත්දැකීම් දරුවාගේ කායික, මානසික, පෞරුෂ වර්ධනය කෙරෙහි විශාල වශයෙන් බලපෑම් කරයි. දරුවෝ තම දෙමාපියන්, සහෝදර සහෝදරියන්, වැඩිහිටියන් අනුකරණය කරමින්, ලෝකය පිළිබඳ අවබෝධ කර ගනිමින්, භාෂා කුසලතා ද වර්ධනය කර ගනිති. ආදරය, කරුණාව, දයාව, සහයෝගිත්වය ආදි මානුෂීය හැඟීම් දරුවා ප්‍රථමයෙන් උකහා ගන්නේ තම පවුල තුළිනි.

පසුව පවුලෙන්, පෙර පාසල හා පාසල වෙත පිය නඟන දරුවා සමවයස් කණ්ඩායම් සමඟ විධිමත් අධ්‍යාපනයක් ලබා ගනී. එහි දී දරුවා සමාජානුයෝජනය වීම හෙවත් දරුවා සමාජයට අනුගත වීම සිදු වේ. නිසි කාලසටහනකට අනුව වැඩකටයුතු කරමින්, පිරිසක් සමඟ එක්ව කටයුතු කිරීමට දරුවාට ආභාසය ලැබෙනුයේ පාසලෙනි. තවද ඒ ඒ රටවල පවතින අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව දරුවා විවිධ විෂය නිර්දේශයන් යටතේ අධ්‍යාපනය ලබයි.

එමතු ද නොව පුද්ගලයකු අධ්‍යාපනය ලබන තවත් එක් ආකාරයක් වන්නේ ජන මාධ්‍යය යි. රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත් ආදි ජනමාධ්‍ය මෙන් ම වර්තමානයේ බහුලව ම භාවිත වන සමාජ මාධ්‍ය මඟින් ද පුද්ගලයෙක් දැනුම හා අධ්‍යාපනය ලබා ගනියි. තමා අවට ලෝකයේ සිදුවන්නේ කුමක් ද යන්න දැනුවත් වෙමින් ජීවත්වීම සඳහා මෙම මාධ්‍යය මහගු පිටිවහලක් වන නමුත් කිසිදු වාරණයකින් තොරව සමාජ මාධ්‍යය මඟින් ඉදිරිපත් වන තොරතුරුවල සත්‍යතාව ඇතැම් විට ගැටලු සහගත විය හැකි ය.

වර්තමානයේ බොහෝ දෙනා අධ්‍යාපනය යනුවෙන් හඳුනා ගන්නේ පොත පතින් ලබාගන්නා විෂයානුබද්ධ කරුණු පමණක් ය යන වැරදි මතයක එල්බී සිටිය ද අධ්‍යාපනය යනු ඊට වඩා පුළුල් පරාසයක විහිදෙන සංකල්පයකි. මේ වැරදි මතය නිසා ම දෙමව්පියන්, ගුරුවරුන් ආදි සියලු දෙනා ම විභාග ඉලක්ක කරගත් දැඩි පීඩාකාරී තරගකාරී අධ්‍යාපන රටාවකට දරුවන්ව අනුගත කරනු ලබයි. ශ්‍රී ලංකාවේ එක්තරා තරගකාරී ම විභාගයකට මුහුණ දෙමින් සිටින සමයක මෙම ලිපිය ලියන මා ද විභාග ආතතිය මඟින් කොතරම් පීඩනයක් ඇති වේ ද යන්න හොඳින් ම අත්දකින බැවින් අධ්‍යාපනය යන්නෙහි සැබෑ අරුත හා එහි අරමුණ ගැඹුරින් සිතා බැලීමට උත්සාහ කිරීම යෝග්‍ය යැයි සිතේ.

විවිධ නිර්ණායක ඔස්සේ ලොව විශිෂ්ටතම විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කර තිබුණ ද ලොව ඇති හොඳ ම සරසවිය වන්නේ ජීවිතය යි. යමකු තම ජීවිත කාලය මුළුල්ලේ ම ලබන අත්දැකීම් ඔස්සේ තම මරණ මොහොත දක්වා ම අධ්‍යාපනය ලබයි. සමාජයේ මිනිසුන් සමඟ ගැටීමෙන්, ජීවිතයේ විවිධ අභියෝග හැලහැප්පීම්වලට මුහුණ දීමෙන් ලබන අත්දැකීම් සමුදාය මඟින්, විවිධ ජයග්‍රහණ පරාජයන් හමුවේ ලබන අධ්‍යාපනය ලොව ඇති හොඳ ම අධ්‍යාපනය ලෙස හැඳින්විය හැකි ය.

අත්දැකීමෙන් තොර අධ්‍යාපන සුදුසුකම් හබලක් නැති ඔරුවක් මෙන් ය. මන්ද හබල නොමැතිව ඔරුවෙන් පමණක් ගඟෙන් එගොඩ විය නො හැකි බැවිනි. විභාග සමත් වීමෙන් ලබන අධ්‍යාපන සුදුසුකම් විභාග සහතිකයට පමණක් සීමා වන අතර තමා ඉගෙන ගන්නා ලද විෂය කරුණු, සංකල්ප, මූලධර්මයන් ප්‍රායෝගිකව ජීවිතයට අදාළ කරගන්නා ආකාරය අත්දැකීම් ඔස්සේ අවබෝධ කරගත හැකි ය. රැකියාවකට ඉල්ලුම්

කිරීමේ දී පවා අධ්‍යාපනික සුදුසුකම් පමණක් තිබීම ප්‍රමාණවත් නොවී අත්දැකීම් හා පළපුරුද්ද ඇති අපේක්ෂකයන්ට ප්‍රමුඛත්වය ලැබෙනුයේ මේ හේතුව නිසා ය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ දැනුම යන්න අතීතයේ මෙන් දුලබ දෙයක් නොවන අතර අන්තර්ජාලය ආදි තාක්ෂණයන් ඔස්සේ ඕනෑ ම අයෙකුට ඕනෑ ම ස්ථානයක දී ප්‍රවේශ වී ලබාගත හැකි පහසු හා ඉතා සුලභ භාණ්ඩයක් බවට පත්ව තිබීම යි. නමුත් අත්දැකීම්, තමා ලබාගත් විධිමත් අධ්‍යාපනයට අමතර වටිනාකමක් එකතු කරනු ලබයි. ඒ අනුව වත්මන් ලෝකයට අවශ්‍ය වන්නේ අත්දැකීම් ලබමින්, තම ජීවන දැක්මට ඒවා සම්බන්ධ කර ගනිමින්, ඉගෙන ගැනීමේ අධ්‍යාපනික ප්‍රවණතාවකි.

මේ අනුව දෙමව්පියන් ගුරුවරුන් ඇතුළු සෑම පුරවැසියෙකුට ම මේ සා විශාල කාර්යභාරයක් පැවරී තිබේ. මානව දයාවෙන් පරිපූර්ණ, ධනාත්මක පෞරුෂයකින් හෙබි, විනයගරුක, ආත්මාභිමානයෙන් යුතු පුරවැසියන් බිහි කිරීමේ අඩිතාලම දැමිය යුත්තේ පවුලෙන් හා පාසල තුළිනි. ඇල්බට් අයින්ස්ටයින් ද වරෙක ප්‍රකාශ කර ඇත්තේ "අධ්‍යාපනය යනු මා පාසලෙන් ඉගෙන ගන්නා සියල්ල අමතක කළ පසු ඉතිරි වන දෙය" යනුවෙනි. එහෙයින් කුඩා කල පටන් නියමිත වේලාවට වැඩ කිරීමට, ස්වභාව ධර්මයට හා සතා සිවුපාවුන්ට ආදරය කරුණාව දැක්වීමට, අන් අයගේ මතයන්ට ගරු කිරීමට, අනෙකාගේ ජයග්‍රහණයේ දී ඊර්ෂ්‍යා නොකර ඒ ගැන සතුටු වීමට, තාර්කිකව සිතීමට හා නිර්මාණශීලී කුසලතා වර්ධනය කර ගැනීමට, හොඳ නරක තෝරා ගැනීමට, කණ්ඩායම් හැඟීමෙන් යුතු ව කටයුතු කිරීමට දරුවෙකුට පවුල හා පාසල මග පෙන්විය යුතු ය.

අතීතයේ දරුවාට ඉගැන්වූයේ සෑම වැඩිහිටියෙකුට ම ගරු කළ යුතු බව යි. වැඩිහිටියන් කරන කියන ඕනෑ ම දෙයක් අනුමත කරමින් එහෙයි කියා හිස් මුදුනින් ම පිළිගැනීමට යි. නමුත් එය සම්පූර්ණයෙන් ම වැරදි මතයකි. නිවැරදි දේ පමණක් නිවැරදි ලෙස දැකීමටත් වැරදි දෙය වැරදි ලෙස දැකීමටත් දරුවන් පුහුණු කළ යුතු අතර වැඩිහිටියන්ට ගරු කළ යුතු නමුත් ඔවුන් කරන සෑම නීතිවිරෝධී, නොමනා ක්‍රියාවක් ම පිළිනොගෙන, අසාධාරණය හමුවේ නොසැලී නොබියව, කොන්ද කෙලින් තබා ගෙන සිට ගැනීමටත්, යුක්තිය උදෙසා නොබියව හඬ නැගීමටත් දරුවන්ට මග පෙන්වීම දෙමව්පියන්ගේ මෙන් ම ගුරුවරුන්ගේ වගකීමක් වේ. එය රටක අනාගත දේශපාලන ගමන් මග තීරණය කිරීමෙහිලා ද වක්‍රාකාරව පිටිවහලක් වනු ඇත.


එසේ හෙයින් ගිරවුන් සේ කටපාඩම් කර විභාග සමත් වීමෙන් ලබන අධ්‍යාපනයට එහා ගොස් දරුවා තුළ පවතින සහජ දක්ෂතා, කුසලතා හඳුනා ගනිමින් ඒවා ඔප් නංවා ගැනීමට අත හිත දෙමින්, ඒ ඔස්සේ තම අනාගතය ගොඩනගා ගැනීමට නම් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් හඳුන්වා දීමට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙන ඒම මෙරට පාලනය කරන නායකයන්ගේ ද වගකීමකි. Edu-Co හෙවත් අධ්‍යාපනය යන ග්‍රීක වචනයේ අර්ථය වන්නේ ද 'ඇතුළතින් පිටතට ගැනීම' යන්නයි. ඒ අනුව සැබෑ දැනුම ඇත්තේ ඇතුළත ය. ගුරුවරයා විසින් කළ යුත්තේ එය පිටතට ගැනීමේ කාර්යය යි. සාර්ථකත්වය, ජයග්‍රහණය, පරාජය යන සංකල්ප සියල්ල එකිනෙකට සාපේක්ෂ ය. ජීවිතයේ අතිසාර්ථක වීමට නම් ඊට පෙර අසාර්ථකත්වයටත්, ජයග්‍රහණ ලැබීමට නම් ඊට පෙර පරාජයටත් මුහුණ දිය යුතු බැවින් ජය පරාජය සම සිතින් විඳ දරා ගැනීමට ද දරුවන්ගේ මනස ශක්තිමත් කිරීම වැඩිහිටියන්ගේ පරම වගකීමකි.

එම නිසා 'උගත මනා ශිල්පයම යි මතු රැකෙනා' යන ප්‍රසිද්ධ පැරණි කියමනට නව මුහුණුවරක් එක් කරමින් උගත් ශිල්පය පමණක් නොව උගත් ශිල්පය ප්‍රායෝගික ජන ජීවිතයට උපයෝගි කර ගැනීම සිදු කළ යුතු ය. ජීවන අත්දැකීම් ඔස්සේ ලබන අධ්‍යාපනය මගින් තමාට මෙන් ම සමාජයටත් ඵලදායි සේවයක් කළ හැකි පුරවැසියන් බිහි කිරීමට නම් අවවාදයට වඩා ආදර්ශය උතුම් යන්න පසක් කර ගනිමින් දෙමව්පියන්, ගුරුවරුන්, වැඩිහිටියන්, ආගමික නායකයන්, රටේ පාලකයන් ලෙස රටට දැයට වැඩදායී අනාගත පරපුරක් බිහි කිරීමට අතහිත දීම සැමගේ ම යුතුකමක් මෙන් ම වගකීමක් ද වන්නේ ය.

**නීතිවේදී ශෙලින්ඩා සමරසිංහ**

# අභීත මෙහෙවරක් කළ පියතුමකුගේ නික්මයාමක්

# ගරු ජෝන් කැමිලස් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා




මෑත කාලීන ශ්‍රී ලංකා සභා ඉතිහාසය තුළ සුවිශේෂී අමරණීය සේවයක් ඉටු කළ නිර්මල මරිය නිකායික පියතුමකු වූ ගරු ජෝන් කැමිලස් ප්‍රනාන්දු පියතුමා 2026 මැයි 12 වන දින නුගේගොඩ නිර්මල මරිය නිකායික පියවරුන්ට අයත් මේරියන් ග්‍රෝ නිවාසයේ දී ස්වර්ගස්ථ විය.

**මුල් දිවිය**

කටුවාපිටියේ ඇන්ඩෘ ප්‍රනාන්දු හා ආනා මරියා ප්‍රනාන්දු යුවලට දාව මෙතුමා උපන්නේ 1939 අගොස්තු 18 වන දා ය. කටුවපිටිය සාන්ත සෙබස්තියන් විදුහලෙන් හා මීගමුව මාරිස්ටෙල්ලා විදුහලෙන් එතුමා අධ්‍යාපනය ලැබී ය. 1960 වර්ෂයේ දී කළුතර 'මවුන්ට් ඊඩන්' ආශ්‍රමයෙන් සිය පැවිදි ජීවිතයේ ආධුනික පුහුණුව ආරම්භ කොට 1961 මැයි 31 සිය ප්‍රථම පැවිදි පොරොන්දුව ලබා දී පැවිදි දිවියට ඇතුළු විය.

කටුවාපිටියේ බැතිමත් කිතුනු පවුලකින් මෙන් ම එකට බැඳුණු ඇදහිල්ලේ සංසයක් වූ මීසමකින් පැමිණීම නිසා ම මානව සබඳතා කෙරෙහි ගැඹුරු හැඟීමකින් යුක්ත ව සිය පියාගේ ආභාසය තුළින් අලුත් හා වෙනස් අයුරකින් සිතීමේ යොමුවක් ද එතුමා සතු විය.

**දෙවන වතිකානු කතිකාවේ බලපෑම**

කැමිලස් ප්‍රනාන්දු පියතුමා එතුමාගේ දේව ධර්ම පුහුණුව ලැබුවේ කතෝලික සභාවේ සුවිශේෂී වෙනස්කම් රැසක් සිදු වූ 2 වන වතිකානු කතිකාව පැවැත්වූ කාල වකවානුව තුළ දී ය. එම කතිකාවේ ප්‍රගතිශීලි ඉගැන්වීම්වලින් නොමඳ ආභාසයක් ලැබූ එතුමා, ජනතාවට සමීප පූජකයකුගේ භූමිකාව හදවතින් වැලඳ ගත්තේය. 1968 අප්‍රියෙල් 19 වන දින කොළඹ 10 මරදානේ ෆාතිමා දෙව් මැදුරේ දී පූජකවරය ලැබී ය.

ඒ අවධිය තුළ ශ්‍රී ලංකාවේ නිර්මල මරිය නිකායේ ඉදිරිගාමී, ප්‍රගතිශීලී, රැඩිකල් පියතුමන්ලා වූ තිස්ස බාලසූරිය, මයිකල් පෝල් රොද්‍රිගු, හිලේරියන් දිසානායක, ඔස්වල්ඩ් පර්ත් වැනි පියතුමන්ලාගේ ඇසුර හා ආභාසය ද එතුමාගේ පූජක දිවිය කෙරෙහි බලපෑ බව එතුමා මේ ලියුම්කරු සමඟ බෙදා ගෙන ඇත.

**කාර්මික පුහුණුව තුළින් තරුණයාට නව මාවතක්**

1975 සිට 1981 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ කතෝලික සමාජ සේවාවේ ඉපැරණි ම ආයතනයක් වන මග්ගොන සාන්ත විසෙන්ති නිවාසයේ වැඩ බලන පරිපාලන පියතුමා ලෙස කටයුතු කළ එතුමා ඉන්පසු ඉන්දියාවට ගොස් කාර්මික අධ්‍යාපනය හැදෑරුවේ ය. විරැකියාවෙන් පෙළෙන උසස් අධ්‍යාපන අවස්ථා අහිමි වන තරුණයන් සඳහා අනාගතයක් තහවුරු කිරීමේ ප්‍රධාන මාවතක් ලෙස කාර්මික අධ්‍යාපනය දුටු මෙතුමා නැවත මග්ගොන සාන්ත විසෙන්ති නිවාසයේ අධ්‍යක්ෂ ලෙස පත්ව ආවේ ය. එතැන් සිට කෘෂිකාර්මික, කාර්මික, මුද්‍රණ ශිල්පීය අංශ වර්ධනය කරමින් සුවිසල් සේවයක් ඉටු කළේ ය.

සිය ස්වාමියා වූ ජේසුස් වහන්සේ වඩු කාර්මිකයෙකු වූවා සේ ම කැමිලස් පියතුමා ද කාර්මික බව කෙරෙහි ඇළුම් කළේ ය. එතුමා පූජක කාර්යය සඳහා ආලේප කළ දෑත්වල මජන්, මැෂින් තෙල් තවරා ගෙන කාර්මික ඇඳුමෙන් සැරසී ළමුන් සමඟ හරි හරියට වැඩ

කරමින් කාර්යස්ථ පුහුණුව ලබා දුන්නේ ය. පූජය හා මිදි රස සේ ම අඹු දඹු ඇණ මුරිච්චි, එතුමාගේ දෑතට සමීප විය. එය නව පූජක අභ්‍යාසයක් ම විය.

### ආකර්ෂණීය දේශනාවාදියා

තරුණ වියේ සිටි කැමිලස් පියතුමාගේ කොණ්ඩය, රැවුල. එතුමාගේ සුවිශේෂී කටහඬ, ළෙන්ගතුභාවය, එකල ජේසුස් වහන්සේගේ ප්‍රතිරූපය විශද කළේ ය. එතුමා ඉතා ආකර්ෂණීය දේශනාවාදියකු විය. තරුණ තරුණියෝ එතුමාට හද බැඳ ගත්හ.

සාම්ප්‍රදායික රාමුවෙන් පිටත සිතීමකට ආරාධනා කළ එතුමාගේ දේශනා නිසා කිපුණු ඇතැමුන් නුවාන දේශනාව අවසන් වී යාමට නො හැකි ලෙස එතුමාගේ වාහනයේ රෝදවල හුළං ඇරිය අවස්ථා ද විය. එහෙත් එතුමා තමා අනුදත් මාවතේ ම ගමන් කළේ ය. ක්‍රිසන්තස් පියතුමා, පීටර්සන් පියතුමා වැනි අය සමඟ එතුමා එකල පැවැත් වූ ධර්ම විවේක ජන හදට බලපෑමක් කරන්නට විය.

### භීෂණ සමයක අහිත සාක්ෂි දැරීමක්

1988-1990 දක්වා ශ්‍රී ලංකාවේ දකුණේ රජයට එරෙහිව තරුණ නැඟිටීමක් ඇති විය. ඒ කාලය තුළ රාජ්‍ය දැවැන්ත මර්දනයක් දියත් කළ අතර තරුණ තරුණියෝ 60000 ක් පමණ ඝාතනයට ලක් වූහ. පියතුමා අභීතව ක්‍රියා කරමින් තරුණ ජීවිත බේරා ගැනීමට ක්‍රියා කළේ ය. අතුරුදහන් වූ තරුණයින් සෙවීමට හමුදා කඳවුරුවලට පවා ගියේ ය. ඒ පිළිබඳ මේ ලියුම්කරු සතු අත්දැකීම් කිහිපයක් ම වේ.

එකල අපගේ කතා නායකයා මග්ගොන සාන්ත විසෙන්ති නිවාසයේ අධ්‍යක්ෂවරයාව සිටියේ ය. කළුතර ප්‍රදේශය තුළ ද අතුරුදහන් කිරීම්, පැහැර ගෙන යාම්, තැන තැන දවාහළු කරන ලද මළ සිරුරු සුලභ විය. අප ගමේ තරුණයකු නිවසට විත් පැහැර ගෙන ගිය අතර ඔහුව සොයන්නට ගිය තවත් අයකු ද පැහැර ගෙන ගියේ ය. කව්ද ? කොහේට ද ? ගැටලු රැසකි. පැහැර ගැනීමට ඔත්තු සැපයූවෝ පල්ලියට ද සම්බන්ධ බව අපි දැන සිටියෙමු.

ඔවුන් දෙදෙනා බේරා ගැනීම සඳහා මැදිහත්විය යුතු වූ අතර ඒ මැදිහත්වීම අපව ද අතුරුදහන් කරන මැදිහත්වීමක් නො වීමට ද වග බලා ගත යුතු විය. ඔවුන් රඳවා ගෙන සිටින්නේ එවකට කුප්‍රකට බෝම්බුවල පිහිටි හමුදා කඳවුරක (වද කඳවුරක) බවට ලද තොරතුරක් අනුව එහි යාමට බලවත් මැදිහත්වීමක් අවැසි විය.

කළුතර දිසාව තුළ සිටි ප්‍රගතිශීලී පූජකයා මග්ගොන මඩමේ ජොන් කැමිලස් පියතුමා ම විය. අවදානම් සහගත වුව ද අපි එතුමාව මූණ ගැසී මේ ගැන මැදිහත්වීමක් පැතුවෙමු. නඩු ඇසීම්, වග විභාග කිසිවකින් තොරව තරුණයින් මරා දැමීම දේව ධර්මයට තබා කිසිදු මනුෂ්‍ය ධර්මයකට එකඟ නො වන බව ඇදහූ සහ ප්‍රකාශ කළ මේ පූජකතුමා, අප සමග හමුදා කඳවුරට යාමට ඉදිරිපත් විය. ඒ ඇතැම් ගමන් ප්‍රතිඵලදායක නො වුණ ද ඒ ඉදිරිපත් වීම ඉතා නිර්භීත එකක් විය.

මේ නිසා ම පියතුමා කෙරෙහි ද, ඇතැමුන්ගේ වපර ඇස යොමු විය. පියතුමාව විවේචනය කරන්නෝ ද, සිටියෝ ය. එහෙත් එතුමා තරුණ ජීවිත ආරක්ෂා කිරීමට නො බියව ක්‍රියා කළේ ය.

1975-1981 කාලය තුළ මග්ගොන සාන්ත විසෙන්ති නිවාසයේ වැඩබලන පරිපාලන සේවා කටයුතු කළ එතුමා කාර්මික අධ්‍යාපනයෙන් පසු නැවත මග්ගොන විසෙන්ති නිවාසයට පැමිණි සුවිසල් වැඩ කොටසක් ඉටු කළේ ය.

මග්ගොන මඩම යැයි හඳුන්වන භූමියට අයත් ඉඩම් කැබලි තරුණයින්ට වෙන් කර දී වගා කටයුතු කිරීමට යොමු කළ කැමිලස් පියතුමා එම භීෂණ සමය තුළ තරුණයින් ආරක්ෂා කිරීම සඳහා බුද්ධිමත්ව ක්‍රියා කළේ ය. ඒ වැඩ පැවරීම තුළින් බොහෝ තරුණයෝ තම ජීවිතයට බොහෝ දේ උගත්තෝ ය.

මහින්ද නාමල්

# ආධ්‍යාත්මික අධ්‍යාපන රටාවක් අවශ්‍ය කරන කාලයක්

වර්තමාන ලෝකය තාක්ෂණය,විද්‍යාව අතින් ඉතා ම ඉහළ දියුණු තත්ත්වයක් උදා කරගෙන ඇති බව නොරහසකි. එහෙත් ඊට සාපේක්ෂව උසස් මානවීය ගුණාංගයන්ගෙන් ක්‍රම ක්‍රමයෙන් පහළ මට්ටමකට යමින් තිබෙන බව පැහැදිලිව දක්නට ලැබේ. මේ හේතුව නිසා වර්තමාන සමාජයේ පාසල් පද්ධතිය තුළ පවා විවිධ හිංසාකාරී, පීඩාකාරී වාතාවරණයන් නිර්මාණය වෙමින් පවතින බව කාටත් දැක ගත හැකි ය. මෙවැනි තත්ත්වයන් යම් තරමකට හෝ පාලනය කළ හැකි වන්නේ ආධ්‍යාත්මික වටිනාකම් සහිත අධ්‍යාපනයකට සිසු දරුවන්ව යොමු කිරීම තුළින් පමණි.

මිනිස් ජීවිතය සාර්ථක කර ගැනීමට අධ්‍යාපනය අත්‍යවශ්‍ය ම සාධකයකි. එය හුදෙක් ම දැනුම වර්ධනය කර ගැනීම සඳහා පමණක් නොව ජීවිතයට ආදර්ශයන් සපයන මඟ පෙන්වීමක් බඳුය. පුද්ගල ජීවිතයේ චරිතය, සදාචාරය, මානව ගුණාංග මෙන් ම සංවේදීභාවය ගොඩනගන තෝතැන්න වන්නේ ද අධ්‍යාපනය යි. වර්තමානයේ බහුලව සිදු වන්නේ රැකියාවක් ලබා ගැනීමට හෝ ආර්ථිකමය සාර්ථකත්වය ලබා ගැනීම උදෙසා මෙවලමක් වශයෙන් අධ්‍යාපනය භාවිත කිරීමකි. මේ නිසා වර්තමාන අධ්‍යාපනය ආධ්‍යාත්මික දිශානතියකට යොමු කරලීමේ කාලෝචිත වූ අවශ්‍යතාවයක් පවතී.

බෞද්ධ දර්ශනය තුළ මිනිසාගේ ආධ්‍යාත්මික සංවර්ධනයේ වැදගත්කම අවධාරණය කර ඇත. "විද්‍යාවෙන් මිනිසා බුද්ධිමත් වන අතර ධර්මයෙන් මිනිසා යහපත් වේ" යන කියමන එය සපථ කර දක්වයි. එසේ ම 'සිඟාලෝවාද සූත්‍රය' වැනි සූත්‍ර දේශනාවල ද ගුරු සිසු සබඳතා පිළිබඳ කදිම විවරණයන් සිදු කර තිබේ. තව ද බෞද්ධ අධ්‍යාපන රටාව තුළ ආචාර්යවරයා සහ උපාධ්‍යායවරයා යනුවෙන් දෙදෙනකු දැකිය හැකි ය. සිසුවාගේ දැනුම, ආකල්ප, කුසලතා ගොඩනැඟීමත් දුර්වලතා සකස් කර ගැනීමට උපදෙස් ලබා දීමත් ආචාර්යවරයා විසින් සිදු කරන අතර සිසුවා ගැන යම්කිසි ගැටලුවක් ඇති වුවහොත් උපාධ්‍යායවරයා වෙත ඔහුව යොමු කරනු ලැබේ. සිසුවාට ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව ලැබෙන තුරු මෙසේ ගුරුවරයාගේ අධීක්ෂණයට ඔහුව යොමු කෙරේ. සිසුවා ධර්ම, විනය ප්‍රගුණ කරමින් ඥාන ගවේෂණය සිදුකිරීම එහි දී සිදු විය. මෙය පෙර අතීතයේ පැවතුණු ආධ්‍යාත්මික අධ්‍යාපන ක්‍රමයේ ලක්ෂණ ලෙස හඳුනාගත හැකි ය.

ශුද්ධ වූ බයිබලයේ බොහෝ තැන්වල ද ආධ්‍යාත්මික අධ්‍යාපනයේ වටිනාකම් පිළිබඳව සඳහන් වෙයි. දෙවියන්ගේ වචනය තුළින් මනුෂ්‍යයාව නිවැරදි මාර්ගයට ගැනීමේ බොහෝ අවස්ථා පෙන්වා දී ඇත.

- ආත්මයාණන්ගේ මඟ පෙන්වීම - ගලාති 05/16-18
- ආත්මයාණන්ගේ ඵල - ගලාති 05/22-24

මෙහි ආත්මීය ඵල වශයෙන් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසීම වැනි කරුණු පෙන්වා දී ඇත. මේවා දෙස බලද්දී ආධ්‍යාත්මික අධ්‍යාපනයේ හර පද්ධතීන් මැනැවින් විදහා දැක්වෙන බව කිව හැකි ය. තවදුරටත් පෙන්වා දෙනවා නම්,

- සදාචාරයේ අගය - හිතෝපදේශය 03/01-03
- නැණවතුන්ගේ වාසනාව - හිතෝපදේශය 03/21-22

වැනි ලියවිලි තුළින් මේ පිළිබඳව අපට අවබෝධයක් ලැබිය හැකි ය. මෙහි සඳහන් වචන අතර, "මාගේ පුත්‍රය විචක්ෂණ බුද්ධිය ද තීක්ෂණ ඥානය ද දියුණු කරගන්න. ඒවා ඔබ කෙරෙන් පහව යන්න ඉඩ නොදෙන්න".

තව ද දෙවියන් වහන්සේගේ වචනය මඟින් මනුෂ්‍යයාව නිවැරදි මාර්ගයට ගෙන යාම බයිබලය තුළ ඉතා මැනවින් තේරුම් කර දී ඇත. එම වචනය පුද්ගලයාගේ ජීවිතයට ආලෝකයක්, පහනක් වන ආකාරය 'ගීතාවලිය' තුළින් ද නිරූපිත ය.

මෙසේ බලන කල අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආධ්‍යාත්මික වූ දිශානතියක් ගොඩ නැඟිමේ ලා ගුරුවරයාගේ භූමිකාවට සුවිශේෂ තැනක් හිමි වේ. ගුරුවරයා දැනුම සම්ප්‍රේෂණය කරන්නකු පමණක් නොව ජීවිතයට ආදර්ශ සපයන මඟ පෙන්වන්නෙකු විය යුතු ය. සමස්ත ලෝකයේ ම අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි යම් බලපෑමක් ඇති කළ 'LETTER TO A TEACHER' නම් ග්‍රන්ථය මුලින්ම රචනා කරන්නේ ඉතාලියේ, වස්කනී ප්‍රදේශයේ බාබියානාවේ පාසලක අධ්‍යාපනය ලැබූ වයස අවුරුදු දහසයක පමණ ශිෂ්‍යයන් අට දෙනකු විසිනි. මොවුන්ට මෙය ලියන්නට මඟ පෙන්වන්නේ 'මිලානි' නම් කතෝලික පියතුමකු විසින් ය. පාසලේ දී සමාජ පංති නිසා දරුවන්ට සිදු වූ අසාධාරණකම් මෙම කෘතියෙන් ලොවට හඬ ගා පවසන්නට හැකි විය. දරුවන්ව අරගල කරවනවාට වඩා ඉතා ම ප්‍රඥාවන්ත ආකාරයකින් සිය ඉල්ලීම් දිනාගන්නා මාර්ගයට යොමු කරවීම මෙම පූජකවරයාගේ සුවිශේෂත්වය යි.

ගුරුවරයා සත්‍ය වශයෙන් ම යහපත් එඬේරකු බඳු ය. යහපත් එඬේරුන් තුළ ගුණගරුක බව, අවංකකම, ස්ථිර චරිත ස්වභාවය, සාධාරණත්වය, ආචාරශීලීත්වය යන ගුණාංග පවතී. මෙම ආධ්‍යාත්මික ලක්ෂණ පුද්ගලයකු තුළ පවතින්නේ නම් ඔහු ඇසුරු කරන, ඔහු ජීවත්වන පරිසරය ද නිතැතින් ම යහපත් ස්ථානයක් වනු ඇත.

වර්තමානයේ පාසල් දරුවන් බොහෝ සේ ආවේගශීලී වී ඇත. එමෙන් ම ඉක්මන් තීරණ වලට පෙලඹීමේ ස්වරූපය ද නිතැතින් ම දැකිය හැකි ය. ගුරු ගෞරවය, වැඩිහිටි ගෞරවය, මෙන් ම සමාජ ගෞරවයද වැඩි තැකීමකට ලක් නො කරමින් සිය මතයට අනුව ලෝකයේ ජීවත් වන්නට යෑමේ ප්‍රවණතාවක් වර්තමාන තරුණ පරපුර තුළින් බොහෝ සේ විද්‍යමාන වේ. මේ හේතු කාරණා හොඳින් අවබෝධ කරගත් ශ්‍රී ලංකා කතෝලික සභාව විසින් සිය අධීක්ෂණය යටතේ පාසල් පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි. මෙම පාසල් තුළ ආධ්‍යාත්මික අධ්‍යාපන රටාවට මූලිකත්වය ලබාදෙමින් සෙසු අධ්‍යාපන කටයුතු ද සිදු කර ගෙන යෑම නිසා එවැනි පාසල් කෙරෙහි සමාජ ආකර්ෂණය වැඩි වී ඇත. එලෙස ම බෞද්ධ පාසල්, මුස්ලිම් පාසල්, හින්දු පාසල් යනුවෙන් ද පාසල් පද්ධතීන් නිර්මාණය වී ඉතා යෙහෙන් ක්‍රියාත්මක වන ආකාරය මේ රට තුළ දැක ගත හැකි ය.

කෙසේ නමුත් විවිධ ආගමික ස්වරූපවලට බෙදී පාසල් නිර්මාණය වනවාට වඩා පවතින පාසල් පද්ධතීන් තුළ වුව ද සිදුවිය යුත්තේ සිසුන් තුළ ආගමික ආධ්‍යාත්මික භාවය සුපෝෂණය කරමින් සමස්ත අධ්‍යාපනය ම ඉහළට නංවාලීම ය. එවිට සමස්ත සමාජය ම ගුණගරුක, විනීතමත්, සාධු ලක්ෂණවලින් හෙබි සමාජයක් බවට පත් වනවා නො අනුමාන යි.

**ශාස්ත්‍රපති කපිල ආසිරි සිල්වා.**
**ගුරු සේවය,**
**ශාන්ත පීතර විදුහල, කොළඹ 04.**

## ලස්සන දේව මැවිල්ල

උදෑසන කීච් බීච් කියන්නේ,
පරිසරයට මනරම් දසුන් මවන්නේ,
හැඩකාරයෝ මිහිරි ගී ගයන්නේ,
වඩු කුරුල්ලා කූඩු හදන්න දක්ෂයෙකි;
පිළිහුඩුවා දක්ෂ දඩයක්කාරයෙකි;
මොනරා ආඩම්බරකාරයෙකි;
මේ අපූරු හැකියා ඇති කිහිපයකි.
කුරුලු පිහාටු තරමට සැහැල්ලු ජීවිත නිදහස් ය.
ගී ගයමින්, රඟමින් කරනා හැඩ රසවත් ය.
රංචු පිටින් සැරිසරනා මේ හැඩකාරයෝ,
විහඟ ලොවේ අලංකාරය යි.
මේ ලස්සන මැවිලිවලට
දෙවිපියාට තුති පුදනෙමු

**එච්. එම්. නෙතුනි ජේත් පෙරේරා**
**6 ශ්‍රේණිය,**
**බප/ගම් සිරිකුරුස විදුහල, ගම්පහ.**

# ඉංග්‍රීසි පන්තිය (කෙටි කතාව)

රණසිංහ මාස්ටර්ගෙ ඉංග්‍රීසි පන්තිය බොහොම ශීඝ්‍රයෙන් ජනප්‍රිය වෙන්න පටන් ගත්තා. දැන් මාස්ටර්ගෙ ගෙදර ඉස්තෝප්පුව කොහොමටවත් ප්‍රමාණවත් වුණේ නැහැ. ගමේ හැමෝගෙම උදවුවෙන් පොඩි මඩුවක් හදාගෙන ඩෙස් පුටු ටිකකුත් සපයා ගත්තෙ ඉංග්‍රීසි ඉගෙනීමේ අවශ්‍යතාව කොයි කාටත් දැනුණු නිසයි. රණසිංහ මාස්ටර් ගුරු වෘත්තියේ හිටි කෙනෙක් නොවෙයි. එයා විශ්‍රාමික හමුදා නිලධාරියෙක්. මේ ගමේ පදිංචියට ආවෙ අහම්බෙන්. එයාගෙ බිරිඳත් ඈත පළාතක කෙනෙක්. දරුවො හිටියෙ නෑ. මුලින් රණසිංහ මාස්ටර් අවට ගෙවල්වල දරුවන්ට, නොමිලයේ පාඩම් කියා දුන්නා. පස්සෙ ගමේ අයගෙ ඉල්ලීමට පන්තිය පටන් ගත්තා. ඒ අය කැමැත්තෙන් ම බොහොම සුළු මුදලක් ගෙවන්න ලැස්ති වුණා.

ඔය අතරෙ දී අසල්වාසී ගමක දෙමළ පවුලක පිරිමි දරුවෙකු හිඟමන් යදින්න ගමට ඇවිල්ලා. රණසිංහ මැඩම් ඒ ළමයාට අනුකම්පා කරලා, ළමයගෙ දෙමාපියන් එක්ක කතා කරගෙන එයාලගෙ ගෙදර නවත්වා ගත්තා. ළමයට ඒ වෙද්දී වයස අවුරුදු හතක් විතර ඇති. පාටින් නම් කළුම කළුයි. මුල දී කෙඳිරි ගගා හිටියට අලුත් ගෙදර අයගෙ ආදරය ඔහුට දැනෙන්න පටන් ගත්ත ම හැම දේ ම හරි ගියා. ගමේ පාසලට ඇතුළු කළා. හැබැයි දරුවා පාසල් ගියේ නම් අකමැත්තෙන්. පාසලේ දී ළමයි ඔහුට උසුළු විසුළු කරන නිසත්, කොන් කළ නිසත් තමයි ඒ. කොහොම හරි මේ කැපකාර මවු පිය දෙපළ ළමයාට උගන්වන්න දැඩි උත්සාහයක් ගත්තා. ළමයගෙ නම වුණේ රාමචන්ද්‍රන්. ඒත් ඔහුව හැඳින්වුණේ 'රාමා' නමින්. පාසලේ දී නම් කෙළින් ම 'දෙමළා' නමින්. රාමාට පාසල අප්‍රිය වුණේ ඒ නිසා. අලුත් තාත්තා, අම්මා නිසා රාමා හැම දේ ම ඉවසගෙන හිටියා. ගෙදර දී පාසල් වැඩ වලට ලැබුණු තල්ලුව නිසා රාමා ඉගෙනීම කර ගෙන ගියා. රාමා වැඩියෙන් ම ආශා කළේ රණසිංහ මාස්ටර්ගෙ ඉංග්‍රීසි පාඩමට.

හවස පන්තියට රාමා ගියේ නැහැ. ඒත් ගෙදරදී මාස්ටර් එක්ක ඉගෙන ගත්තා. හෙමින් හෙමින් ඉංග්‍රීසි කතාවටත් හුරු වුණා. හතේ පන්තියට යද්දී රාමා ලොකු ලොකු ඉංග්‍රීසි පොත් කියවන්නත් පටන් ගත්තා. මාස්ටර්ටයි මැඩම්ටයි හරිම සන්තෝෂ යි. ශේක්ස්පියර්, වර්ඩ්ස්වත් කාව්‍යයෙන් හඬ නගා කියවද්දී එයාලගෙ ඇස්වලට කඳුළු පිරුණා. ඒ තරම් අපූරු උච්චාරණයක්. හැබැයි පාසලේ හිටියෙ ම මුළු ගැන්නිලා. ළමයින්ගේ උසුළු විසුළු නතර වුණත් ඔහු කළ එළියට ආවෙ ම නැහැ. ගුරුවරු වුණත් ඒ ළමයා ඉදිරියට ගන්න උත්සාහ කළේ නැති තරම්. ඔය අතරතුර රට පුරා ඇවිළී ගිය සිංහල දෙමළ ආරවුල නිසා රණසිංහ මාස්ටර් හා මැඩම් හිටියෙත් අවුලෙන්. ගමේ අය නම් ඒ අයට කරදරයක් කළේ නැහැ. ඒත් රාමා හිටියෙ පුදුම බයකින්. පාසලේ අයටත් රාමා දෙමළ බව අමතක වෙලා තිබුණු තරම්. කාලයත් එක්ක සියල්ල සාමාන්‍යකරණය වුණා. සමාජ සංස්කෘතියත් වෙනස් වුණා. රාමාත්, ගමේ අනෙක් ළමයිනුත් කායිකව, මානසිකව වර්ධනය වුණා. තරුණ පිරිසට ඉංග්‍රීසි ඉගෙනීමේ අවශ්‍යතාව මතු වුණා. ඒ අය රණසිංහ මාස්ටර්ගෙ උදව් ඉල්ලුවත්, ඔහු ඊට කැමති වුණේ නැහැ. ඊට හේතු වුණේ, ඔවුන් නිතර ම රාමාව පහත් කොට සැලකීම තේරුම් අරගෙන හිටි නිසා.

"රාමා... තව ම ඔයා ඉස්කෝලෙ දි හැංගිලා ඉන්නව නේ ද...?"

"නෑ... අම්මා... මගෙ පාඩුවේ ඉන්නවා..."

"ඔයා ක්‍රීඩාවලට, තරගවලට එහෙම් ඉදිරිපත් වෙන්නෙ නැද්ද?"

"අනේ... මං ආස නෑ අම්මා..."

රණසිංහ මැඩම්ට හරි දුක යි. දවසක් ඈ පාසලට ගිහින් ගුරුවරු හමු වුණා. හැමෝ ම කිව්වෙ එකම දෙය යි.

"ආ! රාමා හොඳ ළමයෙක්... පාඩුවෙ වැඩ කරගෙන ඉන්නවා..."

"මෙයා බාහිර වැඩවලට ඉදිරිපත් වෙන්නේ

නැත් ද?"

"නෑ... අපි එයාගෙ විශේෂ දක්ෂතාවක් දැකල ම නෑ..."

"ඉංග්‍රීසි හෙම හොඳයි නේ ද?" එහෙම ඇහුවෙ රණසිංහ මැඩම්.

ඒත් රණසිංහ මැඩම්ට හොඳ ප්‍රතිචාර ලැබුණෙ නැහැ. ඒකට හේතු වුණේ රණසිංහ මාස්ටර්ගෙ ඉංග්‍රීසි පන්තිය ගැන ගුරුවරුන්ගේ මනාපයක් නො තිබීම යි. පොඩි ඊර්ෂ්‍යාවක් ඔවුන්ගේ සිත්වල තිබුණු බව රණසිංහ යුවළ දැනගෙන හිටියා. කොහොම වුණත් රණසිංහ යුවළ රාමාගේ අධ්‍යාපනය ඉදිරියට ම ගෙන ගියා.

පාසල් හැර ගිය තරුණ පිරිස ඉංග්‍රීසි පන්තියක් පවත්වන ලෙස ඉල්ලීමට ආ දිනයක දී රාමා දුටු ඔවුන් විවිධ සරදම් කරමින් රාමා වෙහෙසට පත් කළ බව මාස්ටර් අහම්බෙන් දුටුවා. එය ඔහුගේ දැඩි සිත් වේදනාවකට හේතු වුණා. රණසිංහ මාස්ටර් හීන් නූලෙන් වැඩ කරන්න හපනෙක්. ඔහු අමතර වැඩිහිටි පන්තිය ආරම්භ කළා. ඒක සති අන්තයේ පැවැත්වුණේ. මාසයක් දෙකක් ගත වුණා. එක් දිනක රණසිංහ මාස්ටර් නියමිත වේලාවට ගෙදරින් මග ඇරියේ රාමාට උපදෙස් කිහිපයක් දීමෙන් පසුව යි. වෛවාරණ මෝස්තර ඇඳගත් තරුණ තරුණියන් අල්ලාප සල්ලාපයේ යෙදෙමින් සිටියා. එක වර ම ඇසුණු ළපටි කට හඬකින් ඔවුන් කලබල වුණා.

"ගුඩ් ඊව්නිං... රණසිංහ මාස්ටර් හැස් ගෝන් ටූ ද ඩොක්ටර්... හී ආස්ක්ඩ් මී ටූ ඩූ ද ලෙසන්..."

පිරිස එකිනෙකාගේ මුහුණු දෙස බලා ගත්තා. නිහඬව ම පොත් අර ගත්තා.

"ගුඩ් ඊව්නිං..."

ඔවුන් මිමිණුවා... 'සර්' කියන්න නම් පැකිළුණා.

ඉතාම් සරල පැහැදිලිව ව්‍යක්ත ලෙසින් රාමා දිනට නියමිත පාඩම තේරුම් කළා. පන්තිය මීයට පිම්බා වගේ රාමා එක ම සිංහල වචනයක් හෝ භාවිතා නොකර ඡේදය තේරුම් කළ අයුරු රණසිංහ යුවළ රහසින් අහගෙන හිටියා. එක් තරුණියක් නැගිට්ටා.

"කරුණාකර සිංහලෙනුත් විස්තර කරන්න... මී... මී... මල්ලි"

රාමාට 'මල්ලි' කියා ඇහුණු ප්‍රථම අවස්ථාව. ඔහු පැකිළීමකින් තොරව එය ඉටු කළා. 'අපි නිතර ම උත්සාහ කරන්න ඕනෑ... ඉංග්‍රීසි භාෂාව ම භාවිත කරන්න... වැරදි වැරදි හරි කතා කරන්න".

ඔහු අවවාදයකුත් දුන්නා. රාමා පාඩම අවසන් කර අභ්‍යාස මාලාව දෙද්දී රණසිංහ මාස්ටර් පන්තියට ආවා. ළමයි නැගිට්ටා.

"තැන්ක් යූ රාමා... නව් යූ කැන් හැව් අ රෙස්ට්"

රාමා පන්තියෙන් පිට වුණා. රණසිංහ මාස්ටර් පන්තිය සිසාරා නෙත් යොමු කළා. ආකුල ව්‍යාකුල වුණු ඇස් බිමට හැරිලා.

"හරි... හරි වාඩි වෙන්න ළමයි... මට හදිසියේ බෙහෙත් ගන්න යන්න වුණා... කොහොම ද මගෙ ගෝලයා හරියට කරගෙන ගියා ද?"

හැමෝම ගොළු වෙලා. තත්පර කීපයක් ගෙවුණා. එක් කෙනෙක් නැගිට්ටා.

"අපට සමා වෙන්න සර්... අපි... අපි හිතුවේ නෑ..."


"ආ! ඔය ළමයින්ට හරි වැරදි අවබෝධ වුණා නම් ඇති. අපට කිසි කෙනෙකුගෙ බාහිර පෙනුමෙන්වත්, ජාතියෙන්, ආගමෙන්, කුලයෙන්වත් කෙනකු විනිශ්චය කරන්න බෑ... රාමා... මගෙ පුතා, අපේ පුතා තව ම දහවන ශ්‍රේණියේ... ඒ දරුවත් ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය දැනුම උපාධි මට්ටමට ළඟ යි... හැබැයි තව ම මම කොලුවට දිග කලිසමක්වත් අඳින්න ඉඩ දීලා නැහැ... ඉගෙනීම වැඩි තරමට ලෝකය අවබෝධ කර ගන්න ඉඩ හරිනවා... හොඳයි අපි හෙට හමුවෙමු... ගුඩ් ඊව්නිං චිල්රන්..."

"ගුඩ් ඊව්නිං සර්..."

ළමුන් පිටව ගියේ නිහැඬියාව තුරුලු කර ගෙන බව රණසිංහ යුවළ බලා සිටියේ රාමාව ළං කර ගෙන. රාමා නම් හිටියේ පුදුම චකිතයකින්.

**කැතරින් ගුණවර්ධන**

# විලියම් ශේක්ස්පියර්



1564 අප්‍රියෙල් මස විසිතුන් වන දා එංගලන්තයේ ස්ට්‍රැට්ෆෝඩ් (Stratford) හි නමැති කුඩා ග්‍රාමයක විලියම් ශේක්ස්පියර් උපත ලදී. මේ දරුවා අනාගතයේ දී විවිධ දේශ දේශාන්තරවල, බැබළෙන තරුවක් වන බව කිසිවකුට ඉඟියක්වත් නො වී ය.

සාහිත්‍ය ලෝකයේ ඉතිහාසය විප්ලවයකට ගොදුරු කළ මෙම දරුවා ළමා වියට එළඹ යහ මට්ටමේ ද්වීතියික පාසලකට ඇතුළු වී අධ්‍යාපනය හැදෑරී ය. ශේක්ස්පියර් දිළිඳු නොවූ පවුලකින් පැවැත ආ නමුත් එය පොහොසත් පවුලක් ද නො වී ය. මෙම දරුවා අනාගත යම් කාලයක දී මිනිස් චර්යාවන් විශ්ලේෂණය කරමින්, ඒවා ලොව පුරා පතළ වන අන්දමේ විශාල මෙහෙවරක්, මිනිස් චර්යාවන් විශ්ලේෂණය කිරීමේ ලා මනා පරිචයක්, දැඩි ලෙස ද සාධනීය ලෙස ද සකල ලෝක වාසී ප්‍රජාව තුළ ස්ථානගත කළේ ය.

ඔහුගේ ශ්‍රේෂ්ඨ තේමාවන් වූයේ ආදරය (Love), දරිද්‍රතාවය (Poverty), බල තෘෂ්ණාව (Greed for poverty), කුමන්ත්‍රණකාරී වූ ඍණාත්මක බලවේගයන් (Conspiracies), වෛරය (Hatred), කාරුණික බව හා මුසුවන මුදු මෙළොක් බව (Tenderness embedded in kindness), පළිගැනීම (Revenge) ... ආදි වූ හැලහැප්පීම් මඟින්, මිනිස් සිත් සන්තානය තුළ ගිලී පවතින ධනාත්මක, මෙන් ම ඍණාත්මක චිත්තවේග නම් වූ මානුෂීය හැඟීම් ගොනු කර ගනිමින් නිර්මාණය වූ ඉතා ම උසස් මට්ටමේ නාට්‍යයන්, කාව්‍යයන් හා ජනප්‍රිය කථා වස්තූන් තුළින් ජනතාවට ඉතා සංවේදී ලෙසින් ජනගත විය. එසේ ම එම ප්‍රබල අන්දරයන් ළැව් ගින්නක් පැතිරෙන්නා සේ, බ්‍රිතාන්‍ය පුරා පළමුව ද, ඉන් අනතුරුව මුළු මහත් විශ්වය පුරා ද පැතිරුණි.

අතිවිශේෂ නාට්‍ය රචකයකු වූ ද, රංගධරයකු මෙන් ම, නාට්‍ය අධ්‍යක්ෂණයේ ද සමතකු වූ ශේක්ස්පියර් අතිප්‍රබල සුවිශේෂයට බඳු වූ නාට්‍යකරණයට ම අදාළ "ග්ලෝබ් තියටර්" (Globe Theatre) නම් වූ නාට්‍ය සමාගමක් හා නාට්‍යගාරයක් සිය මව් රටට හිමි කරලී ය.

ඔහු වේදිකාව මඟින් දස්කම් දක්වන යුගයේ දී, එම සමාජය "සිය පන්තිය" (Class Protection) රැක ගැනීමේ මාවත තදින් වැළඳ සිටියත්, සෑම පන්තියක ම ජනයා, ශේක්ස්පියර්ගේ කථා වස්තූන්ට, රංගධරයන්ට, අධ්‍යක්ෂණයට වශීකෘත විය. අමන්දානන්දයට පත් වූහ. කෙටියෙන් පැවසුවහොත් "රාජකීය පවුල" පවා මෙම නාට්‍යයන්හි උසස් මට්ටම් පිළිබඳව මුසපත්ව සිටි බව ප්‍රකට ය.

මෙකී සියලු ම නාට්‍යයන්, මිනිස් සිත් තුළ අඩංගු සංවේදී බව, මනස තුළ සිදු වන විසංවාදී සිතුවිලි ධාරා ගැන, හරි හෝ වැරදි කරුණු අඩංගු වීම මඟින් සිත් සන්තානයේ පතුලට ම කිඳා බසින දෙබස් හා හැඟුම්බර බව මනා ලෙස ප්‍රේක්ෂක ජනතාවට ඉදිරිපත් කළ හෙයින් ඔවුහු සන්තුෂ්ටියට සංත්‍රාසයට, ශෝකයට, භීතියට, කෝපයට, වෛර කරන්නට, මිතුරා සතුරකු බවට වෙස් පෙරලන්නට, ආදරණීය බවේ හා ශෘංගාරයෙන් මුසපත් වන්නට එම අදාළ චරිතවලට රිංගා රස වින්දනයේ, සංතුෂ්ටියේ පහස ප්‍රේක්ෂකයන් ලදහ.

මෙම ජනප්‍රිය නාට්‍ය ගැන කථා කිරීමේ දී "මැක්බෙත්" නාට්‍යය මිනිසාගේ දැඩි අභිලාශ මට්ටම් පිළිබඳව අර්ථ කථනයකි. (Ambitions) එසේ ම ඔතෙලෝ නාට්‍යය සැකය සහ ඊර්ෂ්‍යාව

නිසා මිනිසා සිය සතුට විනාශ වන බව පෙන්වන නාට්‍යයක් ලෙස "හැම්ලට්" ද ඉදිරිපත් කළ හැකි ය. ප්‍රබල වූ, දේශපාලන ද්‍රෝහීකම් කෙතෙක් දුර ගමන් ගන්නේ ද යන්න "ජූලියස් සීසර්" නාට්‍යය පෙන්වා දුන්නා මෙන් ම සතුට, විනෝදය, හාස්‍යය, විඩාව වැනි දේවල් ද මිනිස් දිවිය තුළ සැරි සරන බව ද "කින්ග් ලියර්" රජතුමාගේ කථා වස්තුවෙන් ද ස්ඵුට කරන ලදී.

එහෙත් මේ සියලු දත්තයනට වඩා අදටත් වලංගු වන්නේ "ආදරය" යන තේමාව ය, යන්න සනිටුහන් කළ නාට්‍යය වූයේ "රෝමියෝ ජුලියට්" කථා වස්තුව ය. අදටත් සමාජය උඩු යටිකුරු කරන, මහත් තරුණ සමාජයට ග්‍රහණයට ගන්නා සුන්දර කථා වස්තූන් බොහෝ විට "ආදරණීය කථා" නැතහොත් ප්‍රේමණීය කථා වස්තූන් වීම අදටද සත්‍යයකි. වත්මන් සමාජය පවා සසල කරවන, සුන්දරයයි සිතන, හදවත් කළඹන චිත්ත වේගය වන්නේ ස්ත්‍රී පුරුෂ ආකර්ෂණය නිසා ඇති වන රාගයෙන් තොර, උන්මාදනීය පරමාදර්ශී ප්‍රේමණීය කථා වස්තූන් ය. ශේක්ස්පියර් නාට්‍යගත කළ "රෝමියෝ ජුලියට්" ප්‍රේම පුරාවෘත්තය ද එවැන්නකි. "දුටු මොහොතේ සිට පෙමෙන් බැඳුණු" (Love at first sight) පැවසෙන මෙම ප්‍රසිද්ධ ප්‍රේම පුරාණය, හදවත් ආදරයෙන් මුසපත් වීම නිසා ම ශෝචනීය අවසානයකට ගොදුරු විය. මෙම නාට්‍යය අතිශයින් ජනහදවත් බැඳගත් අතර එම කාල පරාසයේ දී නාට්‍යයේ ශෝකාන්තය මුළු ලන්ඩන් නුවර ජනයාව ස්පර්ශ කර තිබුණි.

දශක දෙකක තරම් වූ කාල පරාසයක විලියම් ශේක්ස්පියර් සූරීන් නිම කළ නාට්‍යයන් තිස් නවයකි. ඒවා සුඛාන්තවලින් (Comedies) ද, ශෝකාන්ත (Tragedies) ද එසේ ම ඉතිහාසගත පුරාවෘත්තවලින් ද හෙබි විය. ඔහු රචිත කාව්‍යයන් අතර "සොනට්" කාව්‍යයන් එකසිය පනස් හතරක්. (Sonnets යනු පේළි දහහතරකින් සමන්විත කාව්‍යයන් විශේෂයකි). තවත් ආඛ්‍යායනයන් (Narratives) රැසක් ද රචිත ය. විශේෂ වූ අංගයක් වන්නේ ඔහු විසින් ම බස රැසට එක් කළ යම් යම් පද, වාක්‍ය ඛණ්ඩ ද වීම ය. උදාහරණ ලෙස ඉදිරිපත් කිරීමක් නම්, "Wild goose chase", "Heart of gold", "Break the ice", "What's done", "Wear your heart on sleeve", "Forever and a day", "Good riddence", "In a pickle", "Vanished into thin air" ... වැනි යෙදුම් වේ.

මිනිස් වර්ගයාගේ සන්තාන තුළ අන්තර්ගත විවිධත්වය, ඔහුගේ නිර්මාණ තුළ දැකිය හැකි ය. මෙම ශ්‍රේෂ්ඨ නාට්‍යකරුවාගේ නාට්‍ය හරහා රාජකීයයන්, පෙම්වතුන්, දුෂ්ටයන්, රණකාමීන්, මුග්ධයන්, පරාජිතයන්, සොර දෙටුවන්, පාලක පැලැන්තියේ ප්‍රභූන්, ද්‍රෝහීන්, කල්‍යාණ මිත්‍රයන්, ... මෙකී නොකී විවිධ චරිතාංග ප්‍රක්ෂේපණය කළ ඔහුගේ නාට්‍යයන් හා කෘතීන් සියලු ජන කොට්ඨාස නියෝජනය කරයි.

ඔහු පිළිබඳව ලියැවී ඇති තතු අනුව 1564 වසරේ අප්‍රියෙල් මස විසි තුන්වන දින උපත ලද ඔහු මිය ගියේ 1616 අප්‍රියෙල් විසිතුන්වන දින දී ම ය. වයස අවුරුදු දහ අටේ දී ඔහු "ඈන් හැතවේ" (Ann Hathaway) නම් කාන්තාව හා විවාහ වී ඇත. දරුවෝ සිව් දෙනෙක් මෙම දෙපළට ජනිත වූහ. ලිඛිත ලේඛන අනුව පසු කලෙක විලියම්, එම සමාජය හැර දමා අතුරුදන් වී යයි පැවසේ. කිසිදු විශේෂත්වයක් සනිටුහන් නො කළ ඔහුගේ මෙම අතුරුදන් වීම එම ගම්වාසීනට නොහැඟුණි.

එහෙත් ආශ්චර්යත්වය! ඔහු විදුලි වේගයෙන්, එහෙත් අසීරුතා මැදින් කල එළි බසින්නේ ඔහුගේ රංගධාරී පෞරුෂය සහ නාට්‍යයන් අධ්‍යක්ෂණය තුළිනි. ලන්ඩන් පුරවැසියන් ඔහුගේ උත්කෘෂ්ඨවත් රංගන විලාසය, අධ්‍යක්ෂණය සහ පෞරුෂය හඳුනා ගත්හ. එතැන් පටන් ආපසු හැරීමක් විලියම් ශේක්ස්පියර්ට නම් නොවී ය. අද දක්වා ම එවැන්නක් නොමැති වීම මහත් විමතියකි; ඔහුට ගෞරවයකි.

ඔහු නිසා ස්ථානගත වූ "ග්ලෝබ් තියටර්" (Globe Theatre) යන නාට්‍යගාරය ඔහුගේ රංගන කෞශල්‍යය විදහා දැක්වීමේ කැඩපත විය. එවකට පන්ති ලෙස කල්ලි ගැසී තිබූ ලන්ඩන්

සහ අවට සමාජයේ සෑම කෙනෙක් ම විලියම් ශේක්ස්පියර් වෙත නොසිතූ පරිදි ආකර්ෂණය වූහ. කෙටියෙන් කීවොත් "රාජකීය පවුල" පවා ඔහුගේ රංගනයට නාට්‍යයනට වශීකෘතව, මනා අනුග්‍රහයක් දැක්වී ය.

එංගලන්තයේ "ජාතික කවියා" ලෙස විරුදාවලිය ලද ඔහු, "බාඩ් ඔෆ් ඒවොන්" (The Bard of Avon) ලෙස ද නම් විය. පසු කලෙක ඔහු සිය ගම් පියස බලා නැවක පැමිණ එහි වාසය කර ඇත. ඔහු මිය ගියේ, සිය ගම් පියසේ දී ය.

ශේක්ස්පියර් මහා සූරීන් මිය ගොස් ශතක ගණනාවක් පසු වී ඇතත් අදත් විශ්වය පුරා, ගම් නියම්ගම් සිසාරා, මුහුදු, සාගර, මහා ගංගා, කඳු ශිඛර මිටියාවත් කෙත්වතු, වැඩ බිම් ... තරණය කරමින් තවමත් ඔහුගේ නාමය, ජීවිත කථාව නාට්‍යයන් කාව්‍යයන් ආඛ්‍යානයන් පැතිර යමින් පවතී. ඔහු ගේ නිර්මාණ අමරණීය ය; විශ්වීය ය.

විලියම් ශේක්ස්පියර් පුබුදුවාලූ එම සාහිත්‍යමය පුනරුදය, තව තවත් පණ ගසා නැගිටවමින් මුළු මහද්වීපවල සිය අණසක, ගෞරවය සහ ආදරණීය ආකර්ෂණය රැක ගනිමින් පවතින බව නම් පරම සත්‍යයකි.

**(අන්තර්ජාලය ඇසුරිනි.)**

**පරිවර්තනය - රාධා රන්ජනී ජයවර්ධන.**

# අධ්‍යාත්මය නැති අධ්‍යාපනයක් කුමකට ද?

තවත් හිරු නැඟෙනා දවසක,
හිරු කිරණ වැටී මගේ නෙතට,
සිතුණි ගළපන්නට වචන
අධ්‍යාපනයේ වටිනා බව ගැන
මෙලෙස.

පොත පත දිග හැර,
බලන්නට ලියූ අකුරු දිහා,
එය දුටු මට සිතුණි,
ජීවිත මඟ පැහැදුවේ
මේ පොත පත නේ ද කියා.

පොත පතේ දැනුම ඇත,
විභාග ද සමත් කර ඇත,
කෙතරම් උගත් වුණත් නුඹ,
නැතිනම් මනුස්සකම ළඟ,
කුමකට ද ඉගෙනගෙන තව.

ගුරුවරු වේ දෙවන මා පියන්,
දෙයි දැනුම ළමුන් හටා,
ඒ ද දැනුම පොතට පමණක්,
කොටු නොකොටා,
එය වේ තවත් පිනක්,
කියා දෙනවා නම්
හොඳ ගති ගුණ
නොතේරෙන ළමුන් හටා.

පාසල දෙන්නේ අධ්‍යාපනය නම්,
අධ්‍යාපනය දෙන්නේ අධ්‍යාත්මය නම්,
අධ්‍යාත්මය දෙන්නේ හොඳ ගුණ දම් නම්,
වේ මේ මහ පොළොවත්,
සොඳුරු ලොවක්.

සත්‍ය නැති වේ මහ පොළොවේ,
අසත්‍ය රජ කරයි නිකරුණේ,
නැඟී සිටින්නට අසත්‍ය ඉදිරියේ,
පොත පත දැනුම මෙන් ම
අවශ්‍ය වේ අධ්‍යාත්මය,
ඔබගේ මගේ.

අධ්‍යාපනය දෙයි දැනුම නිසැකෙට,
අධ්‍යාත්මය දෙයි මනුස්සකම හරියට,
මේ දෙක ම ඇති නම් නුඹ ළඟ,
නුඹයි ලොව දිනනා,
ඒ මනුස්ස ජීවය.

ලීවෙමි අකුරු ගළපා,
මගේ සිතුවිලි එක පොකුරට
ලියමි තව තවත්
මගේ පැන ලියවෙන තුරාවට...

**ජනිත් ශාමින්ද**
**දිව්‍ය හෘදයේ ආධුනිකාරාමය,**
**සිඳුපියනිල, බණ්ඩාරවෙල.**

# අධ්‍යාපනය තුළින් අධ්‍යාත්ම විමුක්තියට !




'පොරණ පඬින් කළ පත පොත'
කියවන වුන් දැන් කොහි වෙත ?
විභාගයෙන් සමත් වෙතොත්
ඇතැ යි සිතන වුන් බොහො වෙත

සුභාෂිතය - ගුත්තිල කව
ලෝවැඩ සඟරාව - ලෝකෝපකාරය
ලොවට වැඩ ඇති පැදි ගත්
බලා හිඳී - පොත් හල්වල - පොත් ගුල්වල
'දැල් බඳිනා තුරු' මකුළු කැල

පෙළ පොත්වල අතරින් පතර
සදහම් රුවන් වැලෙන්
අමා වතුරින් - බුත්සරණින්
පළ නො වුණි නම් උපුටනයන්
අපේ සිසු කැල නො දනිති
එවන් පොත්
ලියැවී ඇති බවක් වත්?

එවන් අනගි පොත - පත
පරිශීලනයට මඟ නො පෙන්වන
'උගතුන්' පිරි රටකි මෙලක
දොස් කියා එලක් වේ ද
දරුවනට සිප් හලට යනෙන ?

දහ තුනකි විෂය ධාරාව
නම් පවා අමතක ය දරුවනට
එ බර අඩු කරතැ යි බලා සිටියෙමු
'පරිවර්තන යුගගේ' ආචාරි - මහාචාරින්
එ ද කඩවුණු - බලාපොරොත්තු අතර
තවමත් බලා හිඳිමු
දල්වාන මන - නුවන්
අද - නැහැ... හෙට
ඉටුවේ ද - පෙරුමන් ?

"මොඩියුල" පසෙකලා
'පින්ලන්තෙ' පිං පතා
පෙළ පොතට ඉඩ දෙද්දි
දරුවන්ගෙ සෙත පතා
අනේ අප පාගන්නෙ
වලගයෙන් බව් නො දැන
ඇයි ද ? වල්මත් වුණේ
දරුවන්ගේ ලෝකයට
ලොකු තිතක් ඉතිරි කොට ?

'ආගම' විෂයයක් ම නොව
මඟ යි, දිවි මග දිනන
දයා මෙත හද පිරුණ
දැහැමියාවේ රඳන
ඉගෙනීම සුව සදන
අනාගතය ම රකින
කරමු එය - අධ්‍යාත්ම
සව් - දිරිය බල පුරන!

නීටා අයි. ප්‍රනාන්දු
කඳාන.

# TO DRAW OUT, NOT POUR IN

## Rediscovering the spiritual purpose of education

### The Girl Who Arrived Believing

Sandali was six years old when she first walked into a classroom. For weeks she had spoken of little else: the crisp uniform, the colourful bag, the new pencil case. Her family lived in one of Colombo's most crowded settlements, where tomorrow is never guaranteed. But that morning, none of that mattered. There was only the classroom and the quiet feeling that something important was about to begin.

### A Nation's Pride and Its Hidden Flaw

Sri Lanka has every reason to be proud. Free education from Grade 1 to university has been a right since 1945. It has produced one of the highest literacy rates in South Asia, above 92 percent. Generations of children have become teachers, doctors, and leaders.

Yet something is missing. Young people are academically qualified but emotionally fragile. The system rewards memory over meaning and repetition over reflection. Education is meant to be a pathway to a better future for every child. Yet access to quality learning is often shaped by where a child lives and the resources available to the family. Consequently, the system can widen existing gaps rather than close them. In too many classrooms, the relentless pressure to perform leaves little room for wonder, curiosity, or the slow work of becoming a compassionate human being.

### The True Meaning of Education

The word education comes from the Latin educare, meaning to draw out. It does not mean to fill a vessel. It means to awaken what is already inside a person: latent gifts, hidden strengths, and the capacity for love and discernment. The Book of Proverbs says, "The fear of the Lord is the beginning of wisdom" (Proverbs 9:10). Wisdom is not the same as knowledge. Knowledge can be tested and graded; wisdom is the ability to live well, judge rightly, and love generously. It begins not in the classroom but in the soul.

Jesus was a teacher. He rarely taught facts or formulas. He taught fishermen to see the sacred in a net full of fish, to recognise grace in a mustard seed, and to find forgiveness in a father's embrace. He said, "The greatest among you must be the servant of all" (Matthew 23:11). His classroom was life itself—the dusty roads of Galilee, the crowded markets, the quiet hillsides. His curriculum was the human heart. To

educate in this sense is to accompany a child as they discover their own depth, their own questions, and their own capacity to give and receive love.

**The Unsung Saints in Our Schools**

Sri Lanka has teachers who understand this. They work in under resourced schools with oversized classes. They are underpaid and rarely thanked. They arrive early, stay late, and notice the child who has not eaten, the child who is silent, the child who is hiding tears. They are the unsung saints of our time.

At 'Samata Sarana', which means "Help for All," I serve children from some of Colombo's most vulnerable families, who receive what the formal system rarely offers. They receive the experience of being unconditionally valued. They learn their letters and numbers, certainly, but they also learn something far more fundamental: that they are noticed, accepted, and loved. They discover that they belong, that their lives have worth, and that their dignity does not depend on achievements or test scores. St. John Bosco worked with abandoned street children in 19th century Turin. He put it plainly: "Education is a matter of the heart." When a child feels seen, not as a future exam result but as a living soul, something miraculous unfolds. Fear gives way to trust, and trust opens the door to true learning.

**What a Nation Gains by Drawing Out the Person**

A nation that truly educates its children will not only produce engineers and accountants. It will produce human beings. People who can fail with dignity, because their worth was never tied to perfection. People who can disagree with respect, because they have been listened to themselves. People who can serve without needing applause, because they have tasted the quiet joy of helping another.

Sandali arrived at that classroom door with wonder in her eyes and a new pencil case in her hands. That wonder is sacred. The role of every teacher, parent, and society is not to suppress her natural gifts but to nurture and develop them. "You will know the truth, and the truth will make you free" (John 8:32). That freedom to know yourself, to live with integrity, and to love without conditions is the real goal of education.

It begins with a six year old who arrives believing. It succeeds when the world rewards that belief with patience, kindness, and the courage to draw out rather than pour in.

**Fr. Shalinda Jude, OMI**
**Director,**
**'Samata Sarana'**

# මේ අහන්න...

නිවසට පසු දෙවැනි ගෙදර පාසල ම යි අපට හිතැති
ශිල්ප ඥානයෙන් පිරිපුන් මතු පරපුර දොරට වඩිති
අප වටකර ආදරයෙන් ඉගෙන ගන්න මඟ සලසති
දෙමව්පියන් මුල් කොට ගෙන ගුරු භවතුන් නමදිමු අපි

විදුහලේ දී තම කාලය දරුවන් වෙනුවෙන් යොදවති
සියලු ම පාඩම් නිසි ලෙස සිසුන් වෙතට පිළිගන්වති
අතීතයෙන් යමක් ඉගෙන අදටත් එය එලෙස ම වෙති
ඒ ගුරුවරු දෙවැනි බුදුන් වන බව නම් සහතිකයකි

අධ්‍යාපනයෙන් තනනා දරුවන් හැම ලොවක් වටී
සමාජයට හිතකර බව සිතේ සතුට උතුරා යති
ඔවුන් දකින කොයි කවුරුත් ගුරුවරුන්ට පින් පමුණති
දිගායු ලැබ සුව විඳින්න හද පත්ලෙන් පැතුම් ගෙනෙති

අධ්‍යාත්මික ගුණ සපිරුණු සිසු සමූහය පෙරටුව යති
ඉගෙන ගත්තු පාසල වෙත ප්‍රශංසාව දෝරේ ගලති
ගමේ පාසලෙන් දරුවන් ලෝකය වෙත පිය ඔසවති
කීර්තියක් ලැබ දෙන්නට නිතර නිතර මහන්සි වෙති

මිනිසා තනනා මඟක් ය ආදරෙයෙන් පිරුණු තැනකි
ගුරු ගෝලයෝ ගරු බියකින් එකිනෙකාගේ පිහිටට එති
සහනය ලබන තැන එතැනයි ඉස්කෝලය අමතක නැති
විනයගරුක දරුවෝ මවන ගුරුවරුනට සදා හිතැති

පාසල් සංවර්ධනයට ගුරු - දෙගුරුන් එකමුතු වෙති
ඒ නිසා ම දරුවන් හැම විදුහලට ම හිත යොදවති
සුන්දර වූ ඒ කාලය යළිත් වරක් පතනු මැනවි
බාහිර ටියුෂන් වළකා පාසලින් ම ජයගමු අපි

රූපස් ප්‍රැන්සිස්

# පාඩම්! පාඩම්! පාඩම්!

පාන්දර ම නැගිටිනවා
පාසල වෙත දුව යනවා
හතේ ඉඳන් දෙක වෙනතුරු
පාඩම් - පාඩම් - පාඩම්

සිංහල ආගම
ගණිතය ඉතිහාසය
ලියලා අත රිදෙනවා
පාඩම් - පාඩම් - පාඩම්

දෙමළ ලියනවා
ඉංග්‍රීසි ලියනවා
දෙක ම කියවනවා
කටත් රිදෙනවා

නමුත් ඉතින් අනේ
පාඩම් කරලා කරලා
ටික ටික ලොකු වෙනවා
හොඳ තැනකට එනවා

ඒ වෙනතුරු ඉන්නට ඕනෑනේ
දැන් නම් හරි වෙහෙසයි
වෙහෙස නිවා ගන්න අපට
ජේසුනි සරණ වෙන්නකෝ

**දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු**
**7 වසර,**
**ශා. ජෝශප් විදුහල, මරදාන.**

# මෙන්න තවත් ත්‍යාගයක්...

'භක්ති ප්‍රබෝධනය' කලාපයේ සඳහන් වන එක් තේමාවක් ඔස්සේ ඔබගේ අදහස් අපට ලියන්නට ආරාධනා කරමු. මෙවර **"අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය"** තේමාව යටතේ පළ කර ඇති 'හෙළිදරව්ව' ලිපිය පිළිබඳ යමක් ලියා **"'භක්ති ප්‍රබෝධනය', අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10"** ලිපිනයට තැපැල් කරන්න.

- තමන් තේරුම් ගත් ආකාරයට තමන්ගේ වචනවලින් ලියන්න.
- වචන 300ට වඩා වැඩි නො විය යුතු ය.
- තමන්ගේ ම අත් අකුරින් ලියා එවන්න.

**පාසල්, විශ්වවිද්‍යාල මට්ටමේ හෝ උසස් අධ්‍යාපන කටයුතුවල නිරත වන ඕනෑ ම ශිෂ්‍ය ශිෂ්‍යාවකට හෝ විද්‍යාර්ථියකුට** මේ සඳහා ලිපි ඉදිරිපත් කළ හැකි ය. ප්‍රශස්ත මට්ටමේ ලිපි ඉදිරිපත් කරන තිදෙනකුට වටිනා පොත් තුනක් ත්‍යාග වශයෙන් පිරිනැමේ.

# මනුස්සකමේ පාඩම...





"සාහිත්‍යය කන්න ද?" උන් ඇසුව මුලින්
"ඉතිහාසය කුමට ද?" උන් ඇසුව අපෙන්
යාපනයේ රන් කෙතටත් ගිනි තියමින්
අධ්‍යාපනය නැති තරමට දිනායි ඔවුන්

ඇලපිලි ඉස්පිලි පාපිලි කිලෝ ගණන්
පොවති කවති පාසල් ටියුෂන් ද කරන්
ඉස්පිලි, පාපිලි, හිර වී හතර වරම්
පිස්සු නටනවා ලෝකය උකස් කරන්

විශ්වවිද්‍යාලයේ විශ්වය නැති ම තරම්
හිරව හදනා ෆැක්ටරිය වගේ ඉතිං
පපු කැඩවල් තිබුණත් මහ හතර රියන්
උණු වෙන්නට හදලා ම නෑ උපාධියෙන්

ප්‍රතිසංස්කරණ ගැසට් එහෙම උඩට ඇවිත්
තව වැඩි දියුණු කළ යුතු යැයි කියති ඔවුන්
රොබෝ මැෂින් වී අයි ඇප් උඩට ඇවිත්
මනුස්සකමෙ පාඩම හේදිලා ගිහින්

## අමිතගේ හද ගැස්ම ........



# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය





දේදුනු බලකාය

ඔන්න අද මම ඔයාලට කියන්න යන්නෙ පොතක කතාවක්. හැබැයි ඇත්ත කතාවක්. ඊට කලින් හිතන්නකො මේ ගැන. අපි ඉස්කෝලෙ යන්නෙ ඇයි?, හොඳ ලකුණු ගන්න ද? විභාග සමත් වෙන්න ද? හොඳ රැකියාවක් ගන්න ද? මේ හැම පිළිතුරක් ම වැදගත් වුණත් අධ්‍යාපනයේ සැබෑ අර්ථය මීට වඩා ගැඹුරු යි. අධ්‍යාපනය කියන්නෙ මිනිසකුගේ ජීවිතය ආලෝකවත් කරන, ඔහුට සිහින දකින්නටත්, ඒ සිහින හඹා යන්නටත් ශක්තිය සහ මඟපෙන්වීම ලබා දෙන අපූරු බලවේගයක්.

ඉන්දුනීසියානු ලේඛක ඇන්ඩ්‍රියා හිරාටා විසින් ලියන ලද The Rainbow Troops කෘතියෙන් අපට කියා දෙන පාඩම එය යි. දුප්පත් දරුවන් පිරිසකගේ සත්‍ය ජීවිත අත්දැකීමක් තමයි මේ කතාවෙන් කියවෙන්නෙ. එය "දේදුනු බලකාය" නමින් චූලානන්ද සමරනායක මාමා සිංහලට පරිවර්තනය කරල තියෙනවා.

ඉන්දුනීසියාවේ කුඩා දූපතක ජීවත් වෙන දරුවන් දසදෙනෙක් ඉගෙනීමට උනන්දුවෙන් පාසලකට යනවා. ඒත් ඒ පාසල හරි ම දුප්පත්. පන්ති කාමර ගරා වැටිලා. පොත්පත් හිඟ යි. ඉගෙනුම් උපකරණ නෑ. පාසල වසා දැමීමේ අවදානමක් පවා තියෙනවා. ඒත් මේ දරුවන්ට ආදරය කරන ගුරුවරු දෙදෙනෙක් ඔවුන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කැප වෙනවා. දරුවනුත් සාමූහිකව ඒ කැපවීමත් එක්ක අත්වැල් බැඳන් මහන්සි වෙලා වැඩ කරනවා. දුප්පත් ම දරුවන් පිරිසකගෙ ලස්සන සිහින සැබෑ වෙන්නෙ අන්න ඒ නිස යි. මේ කෘතිය ලියන ඇන්ඩ්‍රියා හිරාටත් ඒ දරු පිරිසෙන් කෙනෙක්.

'දේදුනු බලකාය' පොත ඉන්දුනීසියාවේ පමණක් මිලියන පහකට අධික අලෙවියක් වාර්තා කරනවා. ඒ රටේ මෙතෙක් ඉහළ ම අලෙවියක් සහිත පොතෙහි හිමිකරු විදියට ඇන්ඩ්‍රියා ඉතිහාසයට එක්වෙලා හමාර යි. ඒ වගේ ම රටවල් 23ක මේ පොත පළ වෙලා තියෙනවා. 2008 වසරෙදි මේ පොත ඇසුරින් චිත්‍රපටයක් ද නිර්මාණය වෙනවා. දුප්පත් දරුවකුට ඉහළට ම පියාඹන්න අත්තටු දුන්න අධ්‍යාපනයේ බලය හරි පුදුම යි නේ ද?

මේ කතාවේ ඇති ලස්සන ම පාඩම වෙන්නෙ අධ්‍යාපනය කියන්නෙ විශාල ගොඩනැඟිලි, මිල අධික උපකරණ හෝ සුඛෝපභෝගී පහසුකම් පමණක් නො වන බව යි. ඉගෙනීමට ඇති කැමැත්ත, ගුරුවරුන්ගේ කැපවීම, මිතුරන්ගේ සහයෝගය, කණ්ඩායමක් ලෙස කැපවීම සහ අනාගතය පිළිබඳ බලාපොරොත්තු ඇත්නම් ඕනෑ ම බාධකයක් ජයගත හැකි බව යි.

දේදුනු බලකායේ දරුවන් එකිනෙකාට උදව් කරනවා. අසාර්ථක වන විට ධෛර්යය දෙනවා. ජයග්‍රහණ ලැබූ විට එකට සතුටු වෙනවා. ඒ නිසා අධ්‍යාපනය කියන්නෙ පොත්පත්වල දැනුම පමණක් නෙවෙයි, මිත්‍රත්වය, මනුෂ්‍යත්වය සහ සහයෝගිතාව ගැන ඉගෙනගැනීමත් අධ්‍යාපනයේ ම කොටසක් බව එයාල වටහා ගන්නවා.

ආදර දුවේ පුතේ, අද අපට පාසල්, ගුරුවරුන්, පොත්පත් සහ ඉගෙන ගැනීමට බොහෝ අවස්ථා තිබෙනවා. අපි මුලින් ම හොඳින් අධ්‍යාපනය ලැබීමේ අවශ්‍යතාව සහ වටිනාකම තේරුම් ගන්න ඕනෙ. ඉගෙන ගන්නවා කියන්නෙ විභාග සමත් වීම නෙමෙයි. යහපත් මිනිසුන් ලෙස ජීවත් වන්නට ඉගෙන ගැනීමත් අධ්‍යාපනයේ අනිවාර්ය අංගයක්. අපි අවබෝධ කරගත යුතු වැදගත්ම කාරණය සිහින දකින හදවතතක් සහ ඉගෙනීමට උනන්දු මනසක් ඇත්නම් කිසිදු අභියෝගයක් බාධාවක් නොවන බවයි. වර්ණවත්, දීප්තිමත්, ලස්සන ම දේදුනු බලකායක කෙනෙක් වෙන්න ඔබත් කැමති ද?

තරු නැන්දා

## ප්‍රහේලිකා අංක - 92

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | 4 | | 5 | | ■ |
| | ■ | | ■ | 6 | | ■ | | ■ | 7 |
| 8 | 9 | ■ | 10 | ■ | | ■ | 11 | | |
| 12 | | | | | ■ | 13 | | ■ | |
| 14 | | ■ | | ■ | 15 | | | ■ | |
| ■ | ■ | 16 | | | | | ■ | 17 | |
| 18 | 19 | | ■ | ■ | 20 | | 21 | ■ | ■ |
| 22 | | | 23 | | ■ | ■ | 24 | 25 | 26 |
| 27 | | ■ | | ■ | ■ | 28 | | | |
| | ■ | 29 | | | | | | ■ | |

**හරහට**

1. අධ්‍යාපනය යනු .............. ක්‍රියාවලිය යි.
6. දේවල් දැමීමට භාවිතා වේ.
8. අහිංසක සතෙකි.
11. මාළුවාට පිහිනීමට ආධාර වේ.
12. නිදහසේ සිදු වන, තෝරා නොගෙන තැනින් තැනින් ගත්.
13. යාග සඳහා අඹන භූතයන්ගේ හෝ ග්‍රහයන්ගේ රූප
14. ගොවිතැන් කරන කන්න දෙකෙන් එකකි.
15. ලොව ඇති වටිනා ම, මිල කළ නො හැකි දෙයකි.
16. කාලයත් සමඟ වයසට යන පිරිස
17. ගසක හටගන්නා අස්වැන්න
18. ගොයම් වේලුණු පසු
20. "අනංගයා" තවත් පදයකි.
22. වේදනාව ඇති කරනවා.
24. සම්පූර්ණ දෙයින් හරි අඩ
27. සිදු වන්නා වූ
28. මැණික් විශේෂයකට සහ කතුරුමුරුංගාවලට යෙදෙන තවත් නමකි.
29. වර්තමානයේ ලොව ඇති වඩාත් ම හොඳ ම අධ්‍යාපන ක්‍රමය ඇති රට.

**පහළට**

1. රටක, ජාතියක, පුද්ගලයෙකුගේ අතීතය
2. ඉතා විශාලව හැදෙන, අතුවල සිට ඇදෙන මුල්වලින් ද යුතු ගස් වර්ගයකි.
3. කෙළවර, සීමාව
4. බෝතල් 6ක ද්‍රව ප්‍රමාණය
5. බයිබලයේ වීරවරුන් ගැන සඳහන් පොත
7. අතීතයේ අකුරු ලිවීම පුරුදු වීමට භාවිතා කරන ලදී.
9. රජ මැඳුර
10. මරණය
13. නායකයකු සතු හැකියාවන් මේ නමින් හැඳින්වේ.
15. කැකිරාව සහ ගලෙන්බිඳුණුවැව අතර ඇති ග්‍රාමීය ගොවි ගම්මානයකි.
16. දවල් කාලයෙන් දෙකෙන් පංගුව, වේල, මුරය යන අර්ථ දේ.
18. පන්සල ආශ්‍රිත අධ්‍යාපන ආයතනය
19. නපුරු ගති ඇති පුද්ගලයන්
21. ඉගෙනගත් දැනුම මැන බලන අවස්ථාව
23. දෙව්ලොව ඇති ශක්‍රයාගේ උද්‍යානය
25. ශාක
26. සංගීතයෙහි තාල සම්බන්ධ දශ ප්‍රාණයෙන් එකක්
28. ලිවීම සඳහා භාවිතා වේ.

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා,**
සාන්ත වින්සෙන්ති නිවාසය, මග්ගොන.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2026 අගෝස්තු 15** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්**, රු.2000.00, රු.1500.00, රු.1000.00 බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 92**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර,**
**මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 90 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ආ | 2 ද | 3 ර | 4 ය | ■ | 5 ප | 6 රි | ත | ්‍යා | 7 ග |
| 8 ද | ළ | ඹු | වා | ■ | 9 ණ | ය | ■ | ■ | ං |
| ම් | ■ | ට | ■ | 10 සී | ■ | ■ | 11 අ | ■ | හා |
| ■ | 12 අ | න් | 13 තෝ | නි | 14 මූ | 15 නි | තු | 16 මා | ■ |
| 17 මැ | යි | ■ | ල | ■ | 18 තූ | ව | ර | ලා | ■ |
| ■ | ස් | ■ | 19 ග | 20 ත | ■ | න | ■ | ■ | 21 ව |
| 22 ව | ල | වෙ | ට | වු | 23 වා | ■ | 24 ර | හ | ස් |
| 25 ර | න් | ■ | ටි | ■ | 26 හ | ද | ■ | ■ | ක |
| 27 ම | ත | ය | ■ | 28 බි | න | ර | ■ | 29 තූ | ඩු |
| ■ | ය | ■ | 30 ප්‍රේ | ම | ය | ■ | 31 ස | මා | ව |

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඕීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 90 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 90 සම්පූර්ණ කර අප වෙත එවූ සැමට ම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ට ම සුබ පතන අතර ත්‍යාගලාභීන් වෙත ත්‍යාග යථා කාලයේ දී නිවෙස් වෙත ලැබෙන්නට සලස්වන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුරු එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - රුසේලි ප්‍රනාන්දු, 8 ශ්‍රේණිය, ශු. පවුලේ කන්‍යාරාමය, කළුතර.
- **දෙවන ස්ථානය** - ෂෙහාරා අංජලි පෙරේරා, 12 ශ්‍රේණිය, යහපත් එඬේරාගේ කන්‍යාරාමය, පානදුර.
- **තෙවන ස්ථානය** - මාරියෝ සිතුමිණ පෙරේරා, 12 ශ්‍රේණිය, ශා. ජෝශප් විද්‍යාලය, කොළඹ 10.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2026 සැප්තැම්බර් / ඔක්තෝබර් - "පවුලේ මහිමාලංකාරය"**
(සැප්තැම්බර් / ඔක්තෝබර් කලාපය සඳහා ඔබ එවන ලිපි ජූලි 15ට පෙර අප වෙත එවන්න.)
**2026 නොවැම්බර් / දෙසැම්බර් - "එනවා යනවා"**
(නොවැම්බර් / දෙසැම්බර් කලාපය සඳහා ඔබ එවන ලිපි සැප්තැම්බර් 15ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2026

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය ලෙස හඳුන්වන්නේ කවුරුන්ව ද?

(i) ක්‍රිස්තුන් වහන්සේ (ii) ශුද්ධවූ සභාව
(iii) මරිය තුමිය (iv) ශුද්ධවූ දේශය

(02) දේව ප්‍රසාද නිධානයන්ගේත් දේව ප්‍රසාද නිධානය ලෙස හඳුන්වන සක්‍රමේන්තුව කුමක් ද?

(i) අභිවෘද්ධි ආලේපය (ii) ප්‍රසාද ස්නාපනය
(iii) දිව්‍ය සත්ප්‍රසාදය (iv) ආශීර්වාදකාර බන්ධනය

(03) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) මන්නා භෝජනය / පූප කැඩීමේ ප්‍රාතිහාර්ය
(ii) මෙල්කිසදෙක්ගේ යාගය / වතුර වයින් කිරීමේ ප්‍රාතිහාර්ය
(iii) මන්නා භෝජනය / රෝගීන් සුව කිරීම
(iv) නුමුහුන් පූප අනුභවය හා කුසලානෙන් පානය කිරීම / මළවුන් නැගිටවීමේ ප්‍රාතිහාර්ය

(04) ශුභාරංචි කතුවරුන් හතර දෙනා ම වාර්තා කර ඇති ප්‍රාතිහාර්යය තෝරන්න.

(i) වතුර වයින් කිරීමේ ප්‍රාතිහාර්යය (ii) අංශභාග රෝගියා සුව කිරීම
(iii) ලේමාල ස්ත්‍රීය සුව කිරීමේ ප්‍රාතිහාර්යය (iv) පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යය

(05) ජේසුස් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමානව වැඩ සිටින බව දක්වමින් ප්‍රාතිහාර්යයක් සිදු වූ ස්ථානය වන්නේ කොහේ ද?

(i) රෝමයේ වතිකානු නුවර (ii) ලූර්දු නුවර
(iii) පාදුවා නුවර (iv) ලන්චියානෝ නුවර

(06) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට වන්දනා කරන අවස්ථා ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) මහ බ්‍රහස්පතින්දා/ගොබ් ඉරිදා (ii) සන්ධ්‍යා මෙහෙය තුළ/මාසයේ පළමු බදාදා
(iii) සන්ධ්‍යා මෙහෙය තුළ/මහ බ්‍රහස්පතින්දා (iv) පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය

(07) ජුදෙව්වන් වසරක් පාසා උත්සවාකාරයෙන් පැවැත්වූ මංගල්‍යය කුමක් ද?

(i) අස්වනු මංගල්‍යය (ii) පාස්කු මංගල්‍යය
(iii) නුමුහුන් පූප මංගල්‍යය (iv) කූඩාරම් මංගල්‍යය

(08) පූජකවරය නැමති ප්‍රසාද නිධානය ස්ථාපිත කරන ලද්දේ කවදා ද?

(i) මහ බ්‍රහස්පතින්දා (ii) ආලේලූයියා සෙනසුරාදා (iii) පාස්කු ඉරිදා (iv) ගොබ් ඉරිදා

(09) ඉශ්රායලයේ පුද පූජා බෙදන ප්‍රධාන කොටස් ගණන කීය ද?

(i) 3 යි. (ii) 2 යි. (iii) 8 යි. (iv) 4 යි.

(10) දවන පූජා වර්ග කීය ද?

(i) 2 යි. (ii) 5 යි. (iii) 4 යි. (iv) 7 යි.

(11) නව ගිවිසුමේ පාස්කු යාගයේ බැටළු පෝතකයාණන් වූයේ කවුරුන් ද?

(i) ගවයා (ii) ස්නාවක ජුවාම් තුමා (iii) බැටළුවා (iv) ක්‍රිස්තුන් වහන්සේ

(12) ශුද්ධවූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා ලියූ භාෂා 40ට පරිවර්තනය වූ ග්‍රන්ථය කුමක් ද?

(i) බලාපොරොත්තුවේ එළිපත්ත (ii) බලාපොරොත්තුවේ ප්‍රේමය

(iii) බලාපොරොත්තුවේ ටැඹ (iv) බලාපොරොත්තුවේ මඟ

(13) ශුද්ධවූ දෙවන ජුවාම් පාවුළු මුනිතුමා ශුද්ධවරයට ඔසවන ලද්දේ කවදාද?

(i) 2014/04/27 (ii) 2014/04/17 (iii) 2014/04/07 (iv) 2014/05/27

(14) ප්‍රසාද ස්නාපනයේ දී ප්‍රධාන හා අනිවාර්ය සංකේතය කුමක් ද?

(i) සුදු ඇඳුම (ii) ජලය (iii) ආලේප කිරීම (iv) පාස්කු ඉටි පහන

(15) අභිවෘද්ධි ආලේපය දානය කිරීමට බලය ඇති ප්‍රථම නිල සේවකයා කවුරුන් ද?

(i) මීසම් සේවක පියතුමා (ii) දිසා නායක පියතුමා

(iii) රාජගුරුප්‍රසාදීන් වහන්සේ (iv) තේවාචාරීතුමා

(16) ජේසුස් වහන්සේගේ සුව කිරීම්වල දී වැදගත් වූ සාධකය කුමක් ද?

(i) ආදරය (ii) සමාව දීම (iii) ප්‍රේමය (iv) විශ්වාසය

(17) පූජකවරය දානය කිරීමට බලය ඇත්තේ කාට ද?

(i) රදගුරුතුමන්ට (ii) මීසමේ පියතුමාට (iii) තේවාචාරීතුමන්ට (iv) ගිහියාට

(18) දෙවියන් වහන්සේගේ ආශීර්වාදය තුළ පවුලට ලැබෙන දායාදය කුමක් ද?

(i) මිල මුදල් (ii) වස්තු සම්පත් (iii) දරු සම්පත් (iv) යාන වාහන

(19) ආශීර්වාදකාර බන්ධනය දානය කිරීමේ දී සභාවේ නිල සාක්ෂිකරුවා වශයෙන් සහභාගි වන්නේ කවුරුන් ද?

(i) කන්‍යා සොයුරියන් (ii) පූජාප්‍රසාදීන් වහන්සේ (iii) පූජාවට උදව්වන දරුවන් (iv) අන්නවිරාල

(20) මරිය හමුදාව ආරම්භ කළේ කවුරුන් ද?

(i) ශු. දෙවන ජුවාම් මුනිතුමා (ii) තෙරේසා මව්තුමිය

(iii) ගොඩ්වින් මෙන්ඩිස් මහතා (iv) ෆ්‍රෑන්ක් ඩෆ් මහතා

## පිළිතුරු

| | | | |
|---|---|---|---|
| (01) ii | (02) iii | (03) i | (04) iv |
| (05) iv | (06) iii | (07) ii | (08) i |
| (09) ii | (10) iii | (11) iv | (12) i |
| (13) i | (14) ii | (15) iii | (16) iv |
| (17) i | (18) iii | (19) ii | (20) iv |

**ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**

විදුහල්පතිනිය - මිනු / පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

# පලස්තීනයේ භූගෝලීය පසුබිම

ඕනෑ ම ශිෂ්ටාචාරයක්, සංස්කෘතියක්, දහමක් වර්ධනය වී ගොඩ නැඟීමට භූමියක භූගෝලීය ස්වභාවයේ මෙන් ම එම භූමියේ ජනතාවගේ ජීවන චර්යාව ද බලපෑම් කරනු ඇත. ඒ අනුව කිතු දහම ආරම්භයට පෙර හා ව්‍යාප්තිය සම්බන්ධයෙන් කථා කිරීමේ අවට රාජ්‍යයන්ගේ ශිෂ්ටාචාරයන් බලපා ඇත. මෙසපොතේමියාව, බැබිලෝනියාව, අසිරියාව, ඊජිප්තුව වැනි ප්‍රධාන ශිෂ්ටාචාර ඒ අතර වේ. මිනිසාට අනාවරණය වූ දෙවියන් වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේ මඟින් ජනතාව ගලවාගත්, උන්වහන්සේ ජීවත් වූ දේශය සම්බන්ධව සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණ වේ.

### පලස්තීනයේ භූගෝලීය මායිම්

එම දේශයට පුරාණයේ සිට විවිධ නම් භාවිත වී ඇත. මුල් කාලයේ කානාන් දේශය (දම්පාට සතුන් සිටින දේශය) ලෙස ද, ජුදයින් ඉශ්‍රායෙල් දේශය ලෙස ද අරාබිවරුන් පලස්තීනය යයි ද, ඊජිප්තුවෙන් නික්ම ගිය ඉශ්‍රායෙල්වරු එම දේශය අත්පත් කරගත් පසුව නැවතත් පොරොන්දු දේශය ලෙස ද, බැබිලෝනියාවේ සිට ආරම්භ වී මධ්‍යධරණී වෙරළ මායිම් කොට ඊජිප්තුව (මිසරය) නයිල් ගඟ දක්වා ව්‍යාප්ත වී පවතින අර්ධ කවාකාර භූමිය අඩ සඳ වේ. එම අඩ සඳ ප්‍රදේශයේ පවතින සරුසාර දේශයක් බැවින් එය සරු අඩ සඳ ප්‍රදේශය ලෙස ද ක්‍රිස්තු භක්තිකයන් ශුද්ධවූ දේශය නමින් ද හඳුන්වනු ඇත. ශුද්ධවූ දේශය ලෙස නම් කිරීමට හේතුව වන්නේ ක්‍රිස්තුන් වහන්සේ ගේ උපත, ප්‍රසිද්ධ ජීවිතය, මරණය, ස්වර්ගාරෝහණය යන කරුණු මෙම භූමිය තුළ දී සිදු වූ බැවිනි.

එම භූමියේ උතුරු මායිම ලෙබනන් කඳු පන්තිය ආසන්නයේ "දාන්" ප්‍රදේශය ද, දකුණු මායිම ඉඳුමියා කාන්තාරය ආසන්නයේ "බෙයර්ෂෙබා" ප්‍රදේශය ද, බටහිර මායිම ලෙස "මධ්‍යධරණී මුහුදේ" වෙරළ සීමාව ද, නැගෙනහිර මායිම ලෙස "සිරියානු කාන්තාරය" ද පෙන්වා දිය හැකි ය. භූමියේ පවතින්නේ වියළි කාලගුණයකි. වර්ෂාව ලැබෙන්නේ වසරකට දෙවරක් පමණකි. වර්තමානයේ ඊජිප්තුව, ජොර්දානය, සිරියාව, ලෙබනන් යන රටවල් සමග ගොඩබිමින් සම්බන්ධතා පවත්වයි.


එම භූමියේ උතුරෙන් දාන් සිට දකුණ බෙයර්ෂෙබා දක්වා රටේ මුළු දිග සැතපුම් 150ක් පමණ වේ. එමෙන් ම මධ්‍යධරණී මුහුදු සීමාවේ සිට නැගෙනහිර කාන්තාරය දක්වා දේශයේ මුළු පළල සැතපුම් 50ක් පමණ වේ. දේශයේ මුළු භූමි ප්‍රමාණය වර්ග සැතපුම් 7000 පමණ වන අතර එය වර්ග කිලෝමීටර 11,120 පමණ වේ. ඉශ්‍රායෙල් ජනතාව ජොෂුවා ගේ නායකත්වයෙන් මෙම දේශය අත්පත් කරගැනීමේ දී ජොර්දාන් නදියේ ජෙරිකෝව නැමැති ස්ථානයෙන් භූමියට ඇතුළු වී ඇත. එම ජෙරිකෝව නැමති තොටුපළ විශේෂ වන්නේ ක්‍රිස්තුන් වහන්සේ ස්නාවක ජුවාම් තුමන්ගෙන් බෞතිස්මය ලබාගත් ස්ථානය හෙයිනි. මෙම දේශයේ ප්‍රධාන මාර්ග දෙකකි.

1. **වෙළෙඳ මාවත (මුහුදු මාර්ගය)** - එම පාර මිසරයෙන් ආරම්භ වී ගාසා තීරයට පැමිණ නැවතත් බටහිර වෙරළ තීරය ඔස්සේ ගමන් කර ගලීලය සහ දමස්කය හරහා ගොස් මෙසපොතේමියාවට (වර්තමානයේ ඉරාකය) පැමිණ මාර්ගය අවසන් වේ.
2. **රජ මාවත (යුද්ධ මාර්ගය)** - සීනායි පාළුකරය හරහා පැමිණ නැගෙනහිර කඳු මායිම් කොටගෙන ගමන්කර සිරියාවේ දමස්කය හරහා ගොස් මෙසපොතේමියාව දක්වා ගමන් කර අවසන් වේ.

මෙම දේශය ස්වාභාවික භූමි කලාප 4කට බෙදේ. එම බෙදීම සිදුවන්නේ ජොර්දාන් නදිය කේන්ද්‍ර කරගනිමිනි. ජොර්දාන් නදියේ බටහිර කොටස සහ නැගෙනහිර කොටස මෙම බෙදීමට

පදනම් වේ. ඒ අනුව බෙදී වෙන් වී ඇති කලාප 4 පහත සඳහන් පරිදි ය.

1. වෙරළබඩ තීරුව
2. බටහිර කඳුවැටිය
3. ජෝර්දාන් මිටියාවත
4. නැඟෙනහිර කඳුවැටිය




සටහන : ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා

# ඉලෙක්ට්‍රෝ - තාක්ෂණික පාඨමාලාව 2026

## ජාත්‍යන්තරව පිළිගත් N.V.Q. සහතිකය

- පූර්ණ කාලීන
- අර්ධ කාලීන පාඨමාලා

## න්‍යායික හා ප්‍රායෝගික පුහුණුව

- විදුලි තාක්ෂණ ශිල්පී (වාර්ෂික)
- ඉලෙක්ට්‍රෝනික තාක්ෂණ ශිල්පී (ද්වි වාර්ෂික)
- ශීතකරණ හා වායුසමීකරණ තාක්ෂණ ශිල්පී (වාර්ෂික)
- පරිගණක පාඨමාලා

**නවක සිසුන් බඳවා ගැනීම දැන් ආරම්භ කර ඇත.**





කොළඹ අගරදගුරු පදවියේ තවත් සමාජ සත්කාරයකි

## නව පන්ති ජුනි මාසයේ ඇරඹී ඇත

T.V.E.C. Reg No. P02/0004

ගරු ඇන්තනී ප්‍රනාන්දුපුල්ලේ පියතුමා (අධ්‍යක්ෂ - ඉලෙක්ට්‍රෝ ආයතනය)
386/3, කෙලින් වීදිය, මීගමුව

විමසීම් : 077 7242673 / 077 6241492 / 077 4523153

BCI CAMPUS

# ඔබේ අනාගත සිහිනය සැබෑ කරන තැන



## SCHOOL OF BUSINESS

- Bachelor of Business Management Honours
- BBM (Hons) in Accounting and Finance

- Diploma in Business Management and Analysis
- Diploma in Human Resource Management

## SCHOOL OF COMPUTING

- BSc (Hons) in Information Technology
- BSc (Hons) in Software Engineering

- Diploma in Artificial Intelligence (AI) and Robotics

- Certificate / Advanced Certificate in ICT
- Certificate in Graphic Design
- Certificate in Computer Hardware & Networking
- Certificate in Full-Stack Development
- Certificate in Python Programming

## SCHOOL OF EDUCATION

- BEd (Hons) in Primary Education
- BEd (Hons) in Early Childhood Education

- Higher Diploma in Primary Education
- Higher Diploma in Early Childhood Education

- Certificate in Child Caregiver

## SCHOOL OF PSYCHOLOGY

- BSc (Hons) in Counselling Psychology

- Diploma in Psychological Counselling

- Certificate in Counselling
- Certificate in Addiction Psychology and Substance, Device Abuse
- Certificate in School Counselling

## SCHOOL OF NURSING

- Certificate in Caregiver (NVQ LEVELS 3 & 4)
- Certificate in Nursing Assistant (NVQ LEVELS 3 & 4)

## ACADEMY OF ENGLISH

- Aquinas Diploma in English Language & Literature

- Certificate in Spoken English
- Spoken English & Public Speech (Pathway to Trinity College London Certificate)
- Teaching Knowledge Test (TKT) - Cambridge
- Elementary Italian Language Course

## ACADEMY OF MUSIC

- Certificate in Audio Engineering & Music Production
- Certificate in Pop Piano / Keyboards
- Certificate in Western Classical Piano
- Certificate in Classical Guitar / Pop Guitar
- Certificate in Music Theory
- Certificate in Drums
- Certificate in Pop Vocals
- Certificate in Music for Kids
- Certificate in Music Therapy
- Certificate in Musical Theatre
- BCI Art Class - Drawing & Painting Practice

031 222 4422 | 070 603 5100 www.bci.lk | 495, Minuwangoda Road, Bolawalana, Negombo


මිල රු.100/=
(සහන මිල)


"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ 10 එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/MAGAZINE/03/2026